**කෘෂිකර්මය**


**තේ**

කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 179.3 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති 1983 තේ නිෂ්පාදනය 1956 ට පසුව වාර්තාගත වූ අඩුම නිෂ්පාදනය වේ. මෙය 1982 වර්ෂය හා සසඳන කල කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 8.5 ක හෙවත් සියයට 4.5 ක අඩුවීමක් පෙන්නුම් කරයි. නිෂ්පාදනයේ මෙම අඩුවීම සියළු බිම් ප්‍රදේශයන්හි දක්නට ලැබුණු අතර, අඩුවීම පහළම අගයක් ගනු ලැබුවේ පහත් බිම් කාණ්ඩයන්හිය. එය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.4 ක් හෙවත් සියයට 2.2 කි. උස් බිම් කාණ්ඩයන්හි සහ මැදි බිම් කාණ්ඩයන්හි නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 3.9 කින් (සියයට 5.4 කින්) සහ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 3.2 කින් (සියයට 6.2 කින්) අඩු විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අනුව 1982 වර්ෂය හා සැසඳීමේදී මිළට ගනු ලැබූ දළු වලින් කළ නිෂ්පාදනය හැරුණු කල ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට අයත් වතුවල නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 5.6 කින් (සියයට 8.2 කින්) අඩු වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට අයත් වතුවල නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 4.3 කින් (සියයට 7.5 කින්) අඩු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් මගින් මිළට ගත් දළු වලින් කල තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 0.6 කින් (සියයට 9.7 කින්) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් කළ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.6 කින් (සියයට 12.4 කින්) ද අඩු විය. නමුත් පෞද්ගලික අංශයේ වතුවල, මිළට ගත් දළු වලින් සහ එම වතුවල දළු වලින් කළ තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 2.8 කින් සහ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 0.3 කින් වැඩි විය. ඒ අනුව නිෂ්පාදනය අඩුවීම පිළිබඳව සඳහන් කළයුතු ලක්ෂණය නම් එය ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ට පමණක් සීමා වූ බවයි. නිෂ්පාදනය අඩුවීමේ තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ එම අඩුවීම සම්පූර්ණයෙන්ම පාහේ වර්ෂයේ දෙවන කාර්තුව තුළ සිදුවීමයි. නිෂ්පාදනය අඩුවීමට බලපෑ එක් ප්‍රධාන හේතුවක් නම් වර්ෂයේ මුල් භාගය තුළ පැවති දැඩි නියං තත්ත්වයන්ය. ඒ නිසා පොහොර භාවිතයේ ඇති වූ අඩු වීමද මීට බලපෑ තවත් හේතුවක් විය. සමහරවිට, වර්ෂය තුළ පැවති වඩාත් යහපත් මිළ ගණන්වල වාසිය ලබා ගැනීමට පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන් මෙරු දළු පවා කැඩීමට පෙළඹෙන්නට ඇත. මෙය විශේෂයෙන්ම කුඩා ඉඩම් හිමියන් සම්බන්ධව සත්‍ය විය හැකිය.

පෙර වර්ෂය හා සැසඳීමේදී ඉහළ නැගී පොහොර මිල සහ දිගින් දිගට පැවති නියං තත්ත්වයන් මධ්‍යයේ පවා තේ අංශය සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් 12,800 කින් හෙවත් සියයට 12.5 කින් වැඩි විය. නියඟ ඉතා දැඩිව පැවති දෙවන කාර්තුව තුළ පොහොර නිකුතුවේ ඇති වූ තියුණු අඩුවීම හැරුණුකල වර්ෂයේ අනෙක් කාර්තු වලදී නිකුත් කළ පොහොර ප්‍රමාණය වැඩි විය. පූර්ව වර්ෂය හා සැසඳීමේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් මගින් පාලනය කරනු ලැබූ වතුවල පොහොර භාවිතය මෙට්‍රික් ටොන් 1,706 කින් හෙවත් සියයට 5 කින් වැඩිවූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් පාලනය වූ වතුවල එය මෙට්‍රික් ටොන් 1,130 කින් හෙවත් සියයට 3 කින් වැඩි විය. ලබාගැනීමට හැකි දත්තයන්ට අනුව, පෞද්ගලික අංශයේ වතුවල පොහොර භාවිතය සැළකිය යුතු පරිදි වැඩිවූ බව පෙන්නුම් කරයි. රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ තේ වතු වලට නිකුත් කළ මුළු පොහොර ප්‍රමාණයේ වැඩි වීම, වඩා යහපත් නිෂ්පාදන ආන්තිකයන්හි සහ 1983 වර්ෂයේ දෙවන භාගය තුළ පැවති හිතකර කාලගුණික තත්ත්වයන්ගේ ද ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

තේ වගාව යටතේ ලියාපදිංචි වී ඇති බිම් ප්‍රමාණය 1983 දී සුළු වශයෙන් අඩු විය. නමුත් ලබා ගත හැකි තාවකාලික දත්තයන් අනුව දළු නෙලා ගත හැකි බිම් ප්‍රමාණය පසුගිය වර්ෂයේ මට්ටමේම වාගේ නොවෙනස්ව පැවති බව පෙනේ. මින් හැඟී යන්නේ වර්ෂය තුළ ඇති වූ නිෂ්පාදනයේ අඩුවීම හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවූ බවයි. ජනතා වතු සංවර්ධන මණ්ඩල මගින් පාලනය කළ වතුවල සාමාන්‍ය පලදාව සියයට

## ප්‍රධාන කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය




ශ්‍රී ලංකා මහ බැංකුව.

6 කින්ද, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් පාලනය කළ වතුවල සාමාන්‍ය පලදාව සියයට 9 කින්ද අඩුවූ අතර, වර්ෂයේ මුල් භාගය තුළ පැවති නියං තත්ත්වයන් මීට බලපෑ මූලික හේතුව විය.

### 1 . 12 සංඛ්‍යා සටහන
### තේ සංඛ්‍යා 1981 – 1983

| ශීර්ෂය | ඒකකය | 1981 | 1982 (අ) | 1983 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 210·1 | 187·8 | 179·3 |
| 1·1 උස් බිම් .. | ,, | 80·5 | 71·7 | 67·8 |
| 1·2 මැදි බිම් .. | ,, | 59·3 | 51·6 | 48·4 |
| 1·3 පහත් බිම් .. | ,, | 70·3 | 64·5 | 63·1 |
| 2. තේ වගාව යටතේ ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 245 | 242 | 242 |
| 3. පොහොර නිකුතුව .. | මෙට්‍රික් ටොන් දහස් | 103·3 | 102·7 | 115·5 |
| 4. නැවත වගා කිරීම් .. | හෙක්ටයාර | 2,677 | 2,004 | 1,367 |
| 5. මිළ | | | | |
| 5·1 කොළඹ (ශුද්ධ) .. | කි. ග්‍රෑ./රුපියල් | 17·71 | 22·52 | 36·96 |
| 5·2 අපනයන නැව්ස .. | ,, | 35·14 | 35·03 | 52·52 |
| 6. නිෂ්පාදන වියදම .. | ,, | 18·79 | 22·68 | 23·56(අ) |
| 7. අපනයන .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 183·4 | 181·0 | 157·8 |
| 8. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ | 6,444·0 | 6,342·0 | 8,295·0 |
| | (විගැහි දශ ලක්ෂ) | (284) | (276) | (330) |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය(ඇ) නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් .. | | 5·0 | 4·7 | 4·9 |

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණක්.
සටහන: හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව පිළිබඳ දත්තයන් ලබාගත නොහැකිය.

1981 දී දක්නට තිබූ සැළකිය යුතු වැඩිවීමෙන් පසුව, නැවත වගා කිරීමේ කටයුතු නොකඩවා දෙවන වර්ෂයේදී ද බලාපොරොත්තු කඩ කරවන සුළු විය. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා මගින් නැවත වගා කළ බිම් ප්‍රමාණය 1982 දී හෙක්ටයාර 747 සිට 1983 දී හෙක්ටයාර 487 දක්වා සියයට 35 කින් අඩු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් විසින්ද 1982 දී හෙක්ටයාර 640 සිට 1983 දී හෙක්ටයාර 428 දක්වා නැවත වගා කළ බිම් ප්‍රමාණයේ සියයට 33 ක අඩුවීමක්, වාර්තා කරනු ලැබිය. කුඩා ඉඩම් අංශයේද නැවත වගා කළ බිම් ප්‍රමාණයේ සුළු අඩුවීමක් වාර්තා විනි. නැවත වගා කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර ප්‍රමාණය වර්ෂය තුළදී දෙවරක්, එනම් 1983 මාර්තු සහ නොවැම්බර් මාසයන්හිදී, සංශෝධනය කරනු ලැබීය. මාර්තු මාසයේදී පහත් බිම් කාණ්ඩයන්හි පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් සඳහාද, ඉහළ සහ මධ්‍යම බිම් කාණ්ඩයන්හි රාජ්‍ය අංශයේ වතු සඳහා ද ගෙවූ සහනාධාර ප්‍රමාණය හෙක්ටයාරයකට රුපියල් 24,700 සිට රුපියල් 29,700 දක්වා වැඩි කරනු ලැබීය. උස් බිම් කාණ්ඩයන්හි සහ මධ්‍යම බිම් කාණ්ඩයන්හි පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් සඳහා වූ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 29,700 සිට රුපියල් 35,800 දක්වා වැඩි කළ අතර, පහත් බිම් කාණ්ඩයන්හි රාජ්‍ය අංශයේ වතු සඳහා වූ සහනාධාරය රුපියල් 19,700 සිට රුපියල් 24,700 දක්වා වැඩි කරනු ලැබීය. මෙම ප්‍රතිශෝධනයේත්, වැඩිවූ මිළයන්ගේත්, ප්‍රතිඵලය නැවත වගා කිරීමේ කටයුතුවල පිළිබිඹු නොවූයේ වර්ෂයේ මුල් භාගය තුළ පැවති අයහපත් කාළගුණික තත්ත්වයන් හේතුකොටගෙනය.

මාර්තු මාසයේ කරනු ලැබූ ප්‍රතිශෝධනයෙන් ලබා දුන් සානු බලයන් ඉවත් කෙරෙන අන්දමින් නැවත වගා කිරීමේ පිරිවැයෙහි ඇතිවූ වැඩිවීමට වන්දි ගෙවීමක් වශයෙන් 1983 නොවැම්බර් මාසයේදී සහනාධාර ප්‍රමාණයන් නැවත ප්‍රතිශෝධනය කරනු ලැබීය. පහත් බිම් කාණ්ඩයන්හි පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් සඳහා ද, උස් සහ මැදි බිම් කාණ්ඩයන්හි රාජ්‍ය අංශයේ වතු සඳහාද ගෙවූ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 6,300 කින් වැඩි කළ අතර, උස් සහ මැදි බිම් කාණ්ඩයන්හි පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් සඳහා වූ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 7,200 කින් වැඩි කරනු ලැබීය. පහත් බිම් කාණ්ඩ-යන්හි රාජ්‍ය අංශයේ වතු සඳහා වූ සහනාධාරය රුපියල් 5,300 කින් වැඩි කරනු ලැබීය. වර්ෂය අවසානය වන විට නැවත වගා කොට තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 42,265 ක් හෙවත් තේ වගාව යටතේ ලියාපදිංචිව තිබූ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 17 ක් විය. තේ කර්මාන්තයේ දිගු කාලීන ශක්‍යතාවය සඳහා බෙහෙවින් වැදගත්වන නැවත වගා කිරීමේ වේගය තීව්‍ර කිරීම අත්‍යාවශ්‍ය වන අතර පාළු සිටුවීමද වඩා වැඩි අවධානයක් යොමු විය යුතු කාර්යයක් වන්නේ නැවත වගාව මෙන් නිෂ්පාදනය කෙරේ කෙටි කාලීන වශයෙන් අවාසිදායක බලපෑමක් පාළු සිටුවීම මගින් ඇති නොවීමයි. මෑත අතීතයේදී ඵලදායීතාවයේ අඩුවීමට බලපෑ හේතුන්-ගෙන් එකක් ලෙස පැල සංඛ්‍යාවේ අඩු වීම හඳුනාගෙන ඇති හෙයින් මෙය විශේෂයෙන්ම වැදගත් වේ. මේ සම්බන්ධයෙන් සළකා බැලීමේදී පාළු සිටුවීමේ සහනාධාරය 1983 නොවැම්බර් මාසයේදී එක් පැලයකට රුපියල් 2.00 සිට රුපියල් 4.00 දක්වා වැඩිකිරීම වැදගත් ක්‍රියා මාර්ගයක් ලෙස සැළකිය හැකිය.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි සැපයුමේ ඌනතාවයන් හේතු කොටගෙන 1983 දී තේ මිළෙහි සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 1983 දී සාමාන්‍ය අපනයන මිළ සියයට 50 කින් වැඩි විය. 1983 මැද සිට දක්නට ලැබූ මිළෙහි මෙම වැඩිවීම, ඉහළ නගිමින් පවතින පිරිවැය, අප්‍රමාණවත් නිෂ්පාදන ආන්තිකයන් සහ කළමණාකරන දුර්වලතාවයන් යනාදියෙන් පීඩා විඳිමින් පැවති තේ කර්මාන්තයට ඉමහත් සහනයක් විය.

නිමි තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 1982 දී රුපියල් 22.68 සිට 1983 දී රුපියල් 23.56 දක්වා සියයට 4 කින් වැඩිවී ඇත. නිෂ්පාදකයන්ට සහනයක් සැලසීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් වටිනාකම අනුව අයකරන බද්දේ සීමාව කිලෝ ග්‍රෑමයකට රුපියල් 22.00 සිට රුපියල් 26.00 දක්වා 1983 මාර්තු මාසයේදී වැඩි කරනු ලැබීය. නමුත් බදු අනුපාතිකය සියයට 35 මට්ටමෙම නොවෙනස්ව පැවතුනි. වර්ෂය තුළදී නිෂ්පාදන පිරිවැයේ ඇතිවූ වැඩිවීමෙන් නිෂ්පාදන ආන්තිකයන්ට ඇතිවූ අවාසිදායක බලපෑම වුවමනාවටත් වඩා සමහන් කිරීමට තරම් මිළෙහි ඇතිවූ අනුපාතික වැඩිවීම විශාල විය. ඇත්ත වශයෙන්ම මිළයන්හි ඇතිවූ වැඩිවීම නිසා සියළු තේ වර්ග සඳහා වූ (තේ තොග, පැකැට්ටුවල බහාලන ලද තේ, පසුම්බිවල අසුරන ලද තේ, ක්ෂණික තේ, හරිත තේ) විශේෂිත අපනයන තීරු බද්ද 1983 ජූලි මස සිට බලපවත්වන පරිදි කිලෝ ග්‍රෑමයකට රුපියල් එකකින් ඉහළ නැංවීමට ඉඩ සැලසිනි. තේ මණ්ඩලයේ සෙස් බද්ද 1983 මාර්තු මාසයේදී කිලෝ ග්‍රෑමයකට ශත 90 සිට රුපියල දක්වා ද, නැවත 1983 ජූලි මාසයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.25 දක්වා ද වැඩි කරනු ලැබීය. ඉහළ යන මිළයන් මධ්‍යයේ වුව ද, විශේෂයෙන්ම වර්ෂය අවසානය වන විට එළඹි මට්ටම් මධ්‍යයේද ඵලදායිතාවය වැඩි කිරීමේ සහ නිෂ්පාදන වියදම් අඩු කිරීමේ ඉමහත් අවශ්‍යතාවය අමතක නොකළ යුතු වන්නේ මිළයන් ඉහළ නැගීමේ ක්‍රියාවලිය අවසාන-යේදී නියත වශයෙන්ම නතර විය හැකි බැවිනි.

නිෂ්පාදන වියදමේ ඉහළ නැගීමක් ඇති වුවද ජනතා වතු සංවර්ධන මණ්ඩල සහ රාජ්‍ය වැවිලි සංස්ථා ලාභ ආන්තිකයන් වාර්තා කිරීමට පොහොසත් වූහ. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි වතු මට්ටමේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 3 කින් වැඩිවූ බව තාවකාලික දත්ත-යන්ට අනුව පෙනී යයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි ලාභ ආන්තිකය කිලෝ

ග්‍රෑමයකට රුපියල් 14.00 දක්වාද, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි ලාභ ආන්තිකය කිලෝ ග්‍රෑමයකට රුපියල් 13.00 දක්වා ද 1983 දී වැඩි විය. මෙය ඔවුන්ගේ ද්‍රවශීලතා තත්ත්වය සැළකිය යුතු පරිදි වැඩි දියුණු කළ අතර, බැංකු ණය කෙරෙහි ඇති රැඳියාවද අඩු කරනු ලැබීය.

ආයතනික දුර්වලතාවයන් කිහිපයක් මධ්‍යයේ කුඩා ඉඩම් හිමියන්ට නොකඩවා සිය වගා කටයුතු කරගෙන යාමට සිදුවුවද, ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි වර්ෂය තුළදී ඇති වූ මිළ වැඩි වීමේ වාසිවලින් කොටසක් කුඩා ඉඩම් හිමියන්ටද ලැබුණි. පෙර වර්ෂය හා සැසඳීමේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් පාලනය කරනු ලැබූ කම්හල්වලට සපයනු ලැබූ අමු දළු සඳහා ගෙවූ මිළ සියයට 65 ත් සියයට 87 ත් අතර ප්‍රමාණයකින් වැඩි විය. කෙසේ වෙතත් මිළ වැඩිවීමෙන් ඔවුන්ට අත් වූ වාසි නිසා, ආයතනික ව්‍යුහය, විශේෂයෙන්ම ව්‍යාප්ති සේවා සහ අලෙවි කටයුතු දියුණු කිරීමේ වැදගත්කම අමතක නොකළ යුතුය.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, සමහර ප්‍රදේශවල කුඩා ඉඩම් හිමියන්ට, විශේෂයෙන්ම කුඩා ඉඩම් අංශය බෙහෙවින්ම ගතික වන දකුණු පළාතේ කුඩා ඉඩම් හිමියන්ට, සේවය කිරීම නොකඩවා කරගෙන යනු ලැබීය. එහි ව්‍යාප්ති වැඩපිළිවෙලෙහි කොටසක් ලෙස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් හක්මන මැතිවරණ කොට්ඨාශයේ පස්ගොඩ නව කම්හලක් 1983 මැයි මාසයේදී විවෘත කරනු ලැබූ අතර, බලංගොඩ මැතිවරණ කොට්ඨාශයේ රත්දොළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සතුව පැවති තවත් කම්හලක් අත්පත් කරගන්නා ලදී. ලංකා බැංකුව සහ මහජන බැංකුව ද ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබීය. කෙසේ වෙතත් ආයතනික ණය ලබා ගැනීම සඳහා ඇති අපහසුතාව, කුඩා තේ ඉඩම් හිමියන් වැඩි කොටසක් දිගටම මුහුණපාන බලවත් ප්‍රශ්ණ වලින් එකක් විය. කිහිප වරක් පෙන්වා දී ඇති පරිදි කුඩා ඉඩම් අංශයේ අඛණ්ඩ වර්ධනය සහ ඉහළ ඵලදායිතාව උදෙසා වඩා දියුණු සහ පුළුල් ව්‍යාප්ති සේවාවන්ද සැළකිය යුතු වැදගත්කමකින් යුක්ත වේ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ව්‍යාප්ති සේවා සැපයීම, අලෙවි කිරීම සහ පොහොර බෙදා හැරීම යන කාර්යයන් කෙරේ එහි වැඩි අවධානය යොමු කිරීමෙන් මෙම අරමුණු ඉටුකර ගැනීම උදෙසා උපකාරී විය හැකිය.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

තේ කර්මාන්තයේ තේ නිෂ්පාදනය කිරීමේ අංශය කෙරෙහි බලපාන එක්තරා වෙනස්වීම් කිහිපයක්ද විය. මිළ ආධාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන කම්හල්වලට නිෂ්පාදන ගාස්තු වශයෙන් අඩු කිරීමට ඉඩ දී තිබූ ප්‍රමාණය 1983 මාර්තු මාසයේදී නිමි තේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 6.50 සිට රුපියල් 7.25 දක්වා වැඩි කරනු ලැබීය. මෙහි අරමුණ වූයේ තේ නිෂ්පාදනයේ වියදම වැඩිවීමෙන් ඇතිවූ අවාසිදායක බලපෑම් සමහන් කිරීමය. තමන් අයත්වන බිම් කාණ්ඩයේ සාමාන්‍ය මිළට වඩා ඉහළ සාමාන්‍ය මිළයන් ලබා ගත් කම්හල් සඳහා ගෙවනු ලැබූ ආධාර දීමනාවද සියයට 25 සිට සියයට 35 දක්වා වැඩි කරනු ලැබුවේ ගුණාත්මක අතින් වඩා හොඳ තේ නිෂ්පාදනය කිරීම උනන්දු කිරීමේ අභිප්‍රායෙනි.

පෙර වර්ෂයන්හි වාර්තා කිහිපයකින්ම නැවත නැවතත් අවධාරනය කොට ඇති පරිදි රජයට අයත් වතුවල ක්‍රියාකාරිත්වය අපේක්ෂිත මට්ටමට වඩා පහතින් පැවතුණි. ආයෝජනයේ හිඟකම, නියම සානු බල ක්‍රමයක් නොමැතිවීම, අඩු ඵලදායිතාව සහ ඉහළ යන පිරිවැය රාජ්‍ය අංශයේ ඉඩම් පරිපාලන ආයතනයන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්ණ වලින් සමහරක් විය. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නොකඩවා ගෙනයාම උදෙසා රාජ්‍ය අංශයේ තේ වතුවල (සහ ඒ අනුව බැලීමේදී සියළුම වතුවල) වඩා හොඳ ක්‍රියාකාරිත්වය තීරණාත්මක වැදගත්කමකින් යුක්ත වන හෙයින් වර්ෂය තුළදී ආයෝජනය සහ පරිපාලනය යන අංශයන් සඳහා ඉහළ පූර්වතාවයක් දෙනු ලැබීය. රජයට අයත් වතුවල ඵලදායිතාවය ඉහළ නැංවීමට සහ ඉඩම් උපයෝජනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමටද ආයෝජනය ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය අංශයේ සෑම වත්තක් උදෙසාම මැදි කාලීන ආයෝජන වැඩ පිළිවෙලක් වර්ෂය තුළදී පිළියෙල

කෙරෙමින් පැවතින. පරිපාලකයන්ට සහ අනිකුත් සේවකයන්ට සානුබලයන් නොදී ආයෝජනය පමණක් වැඩි කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වීමට ඉඩ ඇති නිසා රාජ්‍ය අංශයේ වතුවල සානුබල ක්‍රමය නැවත සකස් කිරීම පිළිබඳව දැඩි අවධානයක් යොමු විය. නියමාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවහොත් මෙම ක්‍රියාමාර්ගයන්ගෙන් සතුටුදායක ප්‍රතිඵල නුදුරු අනාගතයේදීම තේ නිෂ්පාදනයෙහි මෙන් ම ජාතික ආර්ථික ක්‍රියාවලියෙහිද පිළිබිඹුවීමට ඉඩ ඇත.

## රබර්

1983 වර්ෂයේ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 135 ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇත. පූර්ව වර්ෂය හා සැසඳීමේදී මෙය සියයට 8 ක වැඩිවීමකි. රබර් වගාව යටතේ ලියාපදිංචිව ඇති මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 71 කට හිමිකම් කියන කුඩා ඉඩම් කාණ්ඩද ඇතුළත් පෞද්ගලික අංශයෙන් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 89 ක් හෙවත් මුළු නිෂ්පාදනයෙන් සියයට 66 ක් ලැබුණි. ලියාපදිංචි මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 29 ක් පමණ වන රාජ්‍ය අංශය මගින් පාලනය වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ගෙන් සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ගෙන් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 46 ක් (මිළදී ගත් රබර් කිරි වලින් නිෂ්පාදනය කරනු ලැබූ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 2.2 ක් ද මෙයට ඇතුළත් වේ.) හෙවත් මුළු නිෂ්පාදනයෙන් සියයට 34 ක් ලැබුණි. නිෂ්පාදනයේ වැඩිවීම සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණය වූයේ එය මුළුමනින්ම පාහේ පෞද්ගලික අංශයට සීමා වීමයි. නිෂ්පාදනයේ මෙම වැඩිවීම සාමාන්‍ය පලදාවේ වැඩිවීම නිසා සිදුවූ අතර, පෞද්ගලික අංශයේ රබර් ගස් සූක්ෂම ආකාරයෙන් කිරි කැපීමට භාජනයවීම පලදාවේ වැඩි වීමට හේතු විය. 1983 වර්ෂයේදී රබර් මිළ ගණන් සැළකිය යුතු ලෙස වැඩිවීම නිසා නිෂ්පාදනය වැඩි කිරීම උදෙසා පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන් සූක්ෂම ආකාරයෙන් කිරි කැපීම සඳහා පෙළඹෙන්නට ඇත. 1983 දී කිරි කැපෙන බිම් ප්‍රමාණය හෙක්ටයාර 164,248 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. මෙය පූර්ව වර්ෂය හා සැසඳීමේදී සියයට 4 ක අඩුවීමකි.

**1 . 13 සංඛ්‍යා සටහන**

**රබර් සංඛ්‍යා 1981 – 1983**

| ශීර්ෂය | ඒකකය | 1981 | 1982 (අ) | 1983(ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 124 | 125 | 135 |
| 2. බිම් ප්‍රමාණය | | | | |
| 2·1 වගාව යටතේ ඇති .. | හෙක්ටයාර දහස් | 205·6 | 205·7 | 205·6 |
| 2·2 කිරි කැපීම යටතේ ඇති .. | හෙක්ටයාර දහස් | 176·0 | 170·7 | 164·2 |
| 3. පලදාව .. | හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් | 705·0 | 729 | 823 |
| 4. පොහොර නිකුතුව .. | මෙට්‍රික් ටොන් දහස් | 16·8 | 16·5 | 18·5 |
| 5. නැවත වගා කිරීම .. | හෙක්ටයාර | 6,442 | 5,866 | 5,119 |
| 6. මිළ | | | | |
| 6·1 අපනයන (නැ. වි. ස.) .. | කි. ග්‍රෑ./රුපියල් | 21·80 | 17·68 | 22·77 |
| 6·2 කොළඹ ආර්. ඇස්. ඇස්. නො. 1 | ,, ,, | 10·04 | 10·18 | 13·95 |
| 7. නිෂ්පාදන වියදම (ඇ) .. | ,, ,, | 8·92 | 9·66 | ලැ. නො. |
| 8. අපනයන .. | කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ | 132·5 | 131·3 | 125·2 |
| 9. දේශීය පරිභෝජනය .. | ,, ,, | 16·2 | 16·4 | 16·4 |
| 10. අපනයන ඉපැයුම් .. | රුපියල් දශ ලක්ෂ<br>(විගැහි දශ ලක්ෂ) | 2,889·0<br>(128) | 2,323·0<br>(101) | 2,852·0<br>(114) |
| 11. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) | | 2·3 | 2·1 | 2·1 |

මූලයන්: රබර් පාලන දෙපාර්තමේන්තුව;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) රාජ්‍ය අංශයේ වතුවල, පෞද්ගලික අංශයේ වතුවල සහ කුඩා වතුවල බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන වියදම.
(ඈ) වගා කිරීම හා සැකසුම් කටයුතුවල පමණි.

නැවත වගාව උදෙසා ගස් උදුරන ලද බිම් ප්‍රමාණය 1982 දී හෙක්ටයාර 7,083 සිට 1983 දී හෙක්ටයාර 5,728 දක්වා සියයට 19 කින් අඩුවිය. නැවත වගාකිරීමේ සහනාධාර සැළකිය යුතු ලෙස වැඩිකර තිබියදී පවා, නැවත වගා කිරීමේ කටයුතු කල්දැමීම කෙරෙහි ඉහළ මිළ ගණන් හේතුකොට ගෙන ලාභදායී තත්ත්වයේ ඇතිවූ වැඩිවීම බලපා ඇති බව පෙනේ.

හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 823 ක් ලෙස ගණන් බලා ඇති 1983 සාමාන්‍ය පලදාව, පූර්ව වර්ෂය හා සැසඳීමේදී සියයට 13 ක සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙය 1978 සිට වාර්තාගත වූ වැඩිම පලදා මට්ටම වන අතර පූර්ව වර්ෂය හා සැසඳීමේදී සියයට 3 ක වැඩිවීමකි. එසේ වුවද, රාජ්‍ය වැවිලි සංස්ථා මගින් පාලනය වූ වතුවල සාමාන්‍ය පලදාව සියයට 3 කින් අඩු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩල මගින් පාලනය වූ වතුවල සාමාන්‍ය පලදාවේ සියයට 1 ක ආන්තික වැඩිවීමක් වාර්තා කරනු ලැබිය. මින් පෙන්නුම් කෙරෙන්නේ සාමාන්‍ය පලදාවේ ඇතිවූ වැඩිවීම කුඩා ඉඩම් කාණ්ඩයන්ද ඇතුළත් පෞද්ගලික අංශයට සම්පූර්ණයෙන්ම පාහේ සීමා වූ බවයි. එසේම, පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන් ඉහළ මිළ ගණන් වලින් වාසි ලබා ගැනීම පිණිස සූක්ෂම ලෙස කිරි කැපීම විශාල ලෙස කරගෙන ගිය බවට දැක්වෙන අදහසද මින් තහවුරු කරයි. අනාගත නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරමින්, රබර් ගස් වල නිෂ්පාදන ආයු කාලය අඩුවීමේ අවදානමක් ඇතිවීම සූක්ෂම ලෙස කිරි කැපීමේ ප්‍රතිඵලය වනු ඇත. ඉකුත් වර්ෂ තුනේදී මෙන් නොව රබර් වගා අංශය සඳහා පොහොර නිකුත් කිරීම් 1983 දී මෙට්‍රික් ටොන් 18,500 දක්වා සියයට 12 කින් වැඩිවිය. නමුත් පූර්ව වර්ෂයේ මෙන්ම ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් විසින් පොහොර භාවිතයේ අඩුවීමක් වාර්තා කරනු ලැබීය. රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි මෙම අඩුවීම මෙට්‍රික් ටොන් 5,400 ක් වූ අතර, ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි එය මෙට්‍රික් ටොන් 100 ක් විය. මින් පෙන්නුම් කරන්නේ 1983 වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ පොහොර භාවිතය සැළකිය යුතු පරිදි වැඩිවූ බවය. ඉහළ මිල ගණන් සහ ඉහළ නිෂ්පාදනය, වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ ඉඩම්වල පොහොර භාවිතය සම්බන්ධව සතුටුදායක බලපෑමක් ඇති කළ බව පෙනෙන්නට ඇත. සමහරවිට පෞද්ගලික අංශයේ වගා කරුවන් ගස් වලින් සූක්ෂම ලෙස කිරි කැපීමෙන් ඇතිවන අවාසිදායක ප්‍රතිවිපාකයන් අවම කිරීමේ අදහසින් පොහොර භාවිතය සැළකිය යුතු පරිදි වැඩිකළා විය හැකිය. නමුත් පෞද්ගලික අංශයේ කුඩා ඉඩම් හිමියන් වැඩිකොටසක් තවමත් කිරි කපන රබර් ඉඩම් සඳහා කිසිසේත් පොහොර භාවිතා නොකරන බව පෙනේ.

තාවකාලික දත්තයනට අනුව වර්ෂය තුළදි නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 5,119 ක් වූ අතර, එය පසුගිය වර්ෂය හා සසඳන කල සියයට 13 ක අඩුවීමකි. කෙසේ වුවද, රාජ්‍ය අංශය නැවත වගා කිරීම සම්බන්ධයෙන් කිසියම් ප්‍රගතියක් පෙන්නුම් කරනු ලැබීය. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් මගින් නැවත වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය 1982 දී හෙක්ටයාර 755 සිට 1983 දී හෙක්ටයාර 871 දක්වා වැඩි වූ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් පාලනයවන වතුවල නැවත වගාකල බිම් ප්‍රමාණය 1982 දී හෙක්ටයාර 812 සිට 1983 දී හෙක්ටයාර 1,030 දක්වා ද වැඩි විය. 1983 වර්ෂය තුළදී ලෝක බැංකු ආධාර යටතේ කළුතර, කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරන රබර් පුනරුත්ථාපන වැඩපිළිවෙල යටතේ හෙක්ටයාර 2,457 ක් නැවත වගා කරනු ලැබීය. මෙය පූර්ව වර්ෂය හා සැසඳීමේදී සියයට 19 කින් අඩු ප්‍රමාණයකි. නැවත වගාකල බිම් ප්‍රමාණයේ සමස්ත අඩුවීම වර්ෂයේ සැළකිය යුතු කොටසක් තුළ පැවති දැඩි නියං තත්ත්වයන්හි අවාසිදායක බලපෑම පිළිබිඹු කරයි. 1983 වර්ෂය අවසාන වන විට නැවත වගාකොට තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 166,780 ක් හෙවත් රබර් වගාව යටතේ ලියාපදිංචි ඇති මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 81 ක් විය.

Central Bank ... LIBRARY
22495
21 APR 20

1983 දී අළුතෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,745 ක් වූ අතර, එය පෙර වර්ෂය හා සැසඳීමේදී හෙක්ටයාර 95 ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ අළුතෙන් වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 126 ක අඩුවීමක් වාර්තා කරනු ලැබිය.

1983 මාර්තු මාසයේදී පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් හිමියන් සඳහා රබර් නැවත වගා කිරීමේ සහනාධාරය හෙක්ටයාරයකට රුපියල් 18,533 සිට රුපියල් 22,239 දක්වා ද, රාජ්‍ය අංශයේ වතු සඳහා හෙක්ටයාරයකට රුපියල් 12,355 සිට රුපියල් 16,062 දක්වාද, වැඩි කරනු ලැබිය. ඒ සමගම නැවත වගා කිරීමේ සෙස් බද්ද කිලෝ ග්‍රෑම් එකකට සත 86 සිට රුපියල් 1.36 දක්වා වැඩි කරනු ලැබූ අතර, එහි අරමුණ වූයේ රබර් නැවත වගා කිරීමේ සෙස් අරමුදලෙහි සම්පත් ප්‍රමාණය වැඩි කිරීමයි.

1983 මාර්තු මාසයේදී අළුතෙන් වගා කිරීම සඳහා දෙනු ලැබූ සහනාධාරය ද ප්‍රතිශෝධනය කරන ලදී. පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් සම්බන්ධයෙන් සහනාධාරය හෙක්ට-යාරයකට රුපියල් 16,680 සිට රුපියල් 20,386 දක්වා ද රාජ්‍ය අංශය සඳහා එය හෙක්ටයාරයකට රුපියල් 6,795 සිට රුපියල් 12,355 දක්වා ද වැඩි කරන ලදී.

රබර් නිෂ්පාදන වියදම සම්බන්ධයෙන් 1983 වර්ෂය සඳහා සම්පූර්ණ දත්තයන් ලබා ගැනීමට නොහැක. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්ගෙන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්ගෙන් ලබාගත හැකි දත්තයන්, ඒවායේ නිෂ්පාදන වියදමේ පිළිවෙලින් සියයට 15 ක සහ සියයට 8 ක වැඩි වීමක් වර්ෂය තුළදී පෙන්නුම් කරනු ලැබිය. කෙසේ වුවද, වර්ෂය තුළදී රබර් මිළ ගණන් සැළකිය යුතු පරිදි වැඩිවීම නිසා නිෂ්පාදන ආන්තිකයන් බෙහෙවින් වැඩි විය. සියළුම නිෂ්පාදන අංශයන් එනම් රාජ්‍ය අංශයේ වතු, පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් හිමියන්, මෙම මිළ වැඩිවීමෙන් වාසි ලැබූ බව පෙනෙන්නට තිබේ. 1983 වර්ෂය සඳහා දත්තයන් ලැබී ඇති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි නිෂ්පාදන ආන්තිකයන් 1982 දී කිලෝ ග්‍රෑමයකට සත 38 සිට 1983 දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 4.60 දක්වා වැඩිවී ඇති බව ඇස්තමේන්තු කොට තිබේ. අංශයන් දෙකෙහි සාපේක්ෂ පලදායිතා මට්ටම් සහ පිරිවැය ව්‍යුහයන් අනුව බැලීමේදී පෞද්ගලික අංශයේ වතු සහ කුඩා ඉඩම් හිමියන් වර්ෂය තුළදී රාජ්‍ය අංශයට වඩා බෙහෙවින් වාසිදායක නිෂ්පාදන ආන්තිකයන් ලබන්නට ඇතැයි පැවසිය හැකිය.

රාජ්‍ය අංශයේ තේ වතු සම්බන්ධයෙන් මෙන්ම රජය, පොදුවේ රබර් වගාව, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ රබර් වතු පුනරුත්ථාපනය කිරීමේ වැදගත්කම පිළිගෙන තිබේ. නිෂ්පාදන පදනම වැඩි දියුණු කිරීම, නිෂ්පාදනයේ ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම සහ නිෂ්පාදන පිරි-වැය අඩු කිරීම උදෙසා ජනතා වතු සංවර්ධන මණ්ඩලයන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන් මගින් පාලනය වන රබර් වතු සම්බන්ධයෙන් සෑම වත්තක් සඳහාම මැදි කාලීන ආයෝජන වැඩ පිළිවෙලක් පිළියෙල කරමින් පැවතුනි. විදේශ මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අරමුදල් කොටසක් සහිතව මෙම වැඩ පිළිවෙල 1984 දී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. මෙම ආයෝජන වැඩ පිළිවෙලේ ආර්ථික ප්‍රතිලාභ අනුපාතිකය ආයෝජනයේ වාසි අවුරුදු 20 ක කාලච්ඡේදයක් තුළදී ලබා ගත හැකිය යන උපකල්පනය මත සියයට 16 ක් වනසේ තාවකාලිකව ඇස්තමේන්තු කොට තිබේ.

බොහෝ දුරට රබර් වගාවේ දිගුකාලීන නිෂ්පාදන තත්ත්වයන් රඳා පවතින්නේ රබර් වගාව යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයෙන් සැළකිය යුතු කොටසකට හිමිකම් කියන කුඩා ඉඩම් අංශයේ සිදුවන්නේ කුමක්ද යන්න මතය. ව්‍යාප්ති සේවාවන් හිඟකම, ණය සහ අලෙවි කිරීමේ පහසුකම් හිඟකම යනාදී ආයතනික දුර්වලතාවයන් අවම කිරීම උදෙසා තවදුරටත් දැඩි ප්‍රයත්නයක් දරනු ලැබුවහොත් මෙම අංශයේ වඩා ඉහළ නිෂ්පාදනයක් ලබා ගැනීමට ඇති හැකියාවන් සාධාරණ කාලච්ඡේදයක් තුළදී ඉටු කර ගැනීමට හැකි වනු ඇත.

දේශීය රබර් පරිභෝජනය 1983 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 16.4 ක් ලෙස ඇස්තමේන්තු කොට තිබේ. මෙය පූර්ව වර්ෂය සඳහා වාර්තා කරනු ලැබූ ප්‍රමාණයට සමාන වේ. මෙයින් පෙන්නුම් කරන්නේ රබර් මත පදනම් වූ කර්මාන්තයන් වර්ෂය තුළදී ප්‍රසාරණයවී නොමැති බවයි. දේශීය රබර් පරිභෝජනයෙන් වැඩි කොටසකට හිමිකම් කියන ශ්‍රී ලංකා ටයර් සංස්ථාව එහි මුළු ධාරිතාවට වඩා බෙහෙවින් අඩු මට්ටමකට ක්‍රියාත්මක වෙමින් පැවතින. ඌණධාරිතාවයකින් ක්‍රියාත්මකවීම සහ වාසිදායක වෙළඳපල තත්ත්වයන් ද සලකා බලනවිට සංස්ථාවේ නිෂ්පාදනය වැඩි කිරීමට ඇති අවශ්‍යතාවය අවධාරණයකින් කිවයුතු නොවේ.

## පොල්

පසුගිය වසර කිහිපය තුළදී ඉහළ යාමේ උපනතියක් දැක්වූ පොල් නිෂ්පාදනය 1983 වර්ෂයේදී දැඩි පසුබෑස්මකට ලක් විය. 1983 වර්ෂයේ නිෂ්පාදනය පොල් ගෙඩි දශ ලක්ෂ 2,313ක් ලෙස තාවකාලිකව ගණන් බලා ඇත. මෙය ඉකුත් වසර හා සසඳන කල සියයට 8 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. ඉකුත් වසරේ අදාළ කාලච්ඡේදයන් හා සසඳන කල වර්ෂයේ මුල් භාගයේ නිෂ්පාදනය සියයට 3 කින් පහත වැටුණු අතර, වර්ෂයේ දෙවන භාගයේ නිෂ්පාදනය සියයට 13 කින් පහත වැටී ඇත. 1983 වර්ෂයේ වැඩි කාලයක් පුරා පැවති නියං තත්ත්වයන් නිෂ්පාදනයේ මෙම ඉහළ යෑමේ උපනතිය වෙනස් කිරීමට මූලික වශයෙන් හේතු වී ඇත.

ඉකුත් වසරේ අදාළ කාලච්ඡේදයන් හා සසඳන කල වර්ෂයේ මුල් භාගයේදී, පොල්තෙල් නිෂ්පාදනය සියයට 17 කින් පහත වැටුණු අතර, දෙවන භාගයේදී එය සියයට 30 කින් පහත වැටුණි. වාර්ෂික නිෂ්පාදනයේ මුළු පහත වැටීම සියයට 24 කි. ඉකුත් වර්ෂයේ එම කාලසීමාවන් හා සැසඳීමේදී කපාපු පොල් නිෂ්පාදනය වර්ෂයේ මුල් භාගයේදී සියයට 10 කින් අඩුවූ අතර, දෙවන භාගයේ දී සියයට 17 කින් වැඩි විය. ඉකුත් වසරේ මුළු නිෂ්පාදනය හා සසඳන කල කපාපු පොල් නිෂ්පාදනය සියයට 4 ක සුළු වැඩිවීමක් දැක්විය. වර්ෂයේ මුල් භාගය තුළදී පොල් තෙල් හා කපාපු පොල් නිෂ්පාදනයේ අඩු වීමට පොල් ගෙඩි නිෂ්පාදනය පහත වැටීම එක් හේතුවක් වූ අතර, අනෙක් හේතුව වූයේ වෙළඳපලේ පොල් මිළ ඉහළ යාම නිසා පොල්තෙල් සහ කපාපු පොල් නිෂ්පාදනය සඳහා සැපයුණු ගෙඩි ප්‍රමාණය අඩු වීමය.

වර්ෂයේ දෙවන භාගය තුළදී ගෙඩි නිෂ්පාදනය පහත වැටීම හා වෙළඳපලේ පොල් මිළ ඉහළ යාම, පොල්තෙල් නිෂ්පාදනය කෙරේ දිගටම අහිතකරව බලපෑවේය. මෙම කාලය තුළදී කපාපු පොල් නිෂ්පාදනය වැඩිවීමට හේතු වූ එක් කරුණක් වූයේ කපාපු පොල් නිෂ්පාදනයට හිතකර වන අයුරින් සාපේක්ෂ මිළ ගණන් වෙනස් වීමත්, විදේශ වෙළෙඳපලවල් රැකගැනීම සඳහා කපාපු පොල් නිෂ්පාදකයන් නිෂ්පාදනය නැංවීමට ගත් ආයාසයත්ය. 1983 සැප්තැම්බර් මස හඳුන්වා දෙන ලද අපනයන දිරිගැන්වීම් යෝජනා ක්‍රමය යටතේ සාමාන්‍ය නිෂ්පාදන මට්ටමට අමතරව නිෂ්පාදනය කෙරෙන කපාපු පොල් මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 2,000 ක් ප්‍රදානය කිරීමද, කපාපු පොල් කර්මාන්තයේ සාපේක්ෂ වශයෙන් වූ මෙම යහපත් ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑ එක් හේතුවක් වන්නට ඇත.

1983 ජූලි කලබල පැවති වකවානුව තුළදී මෙට්‍රික් ටොන් 47,000 ක මුළු වාර්ෂික නිෂ්පාදන ධාරිතාවක් පැවති පොල්තෙල් මෝල් නවයක් විනාශයට පත්ව ඇත. කෙසේ වුවද, මෙරට පොල්තෙල් මෝල්වල නිෂ්පාදන ධාරිතාව අවශ්‍යතාවයනට වඩා බෙහෙවින් වැඩි හෙයින් මින් නිෂ්පාදනය කෙරේ සැළකිය යුතු බලපෑමක් ඇති වූයේ නැත. අගෝස්තු මස 12 වැනි දින ඇති කරනු ලැබූ අපනයන තහනම වහා අගෝස්තු මස 31 වැනි දින ඉවත් කර ගනු ලැබීම තුළින්ද මෙම කරුණ පැහැදිලිව පිළිබිඹුවේ. 1980 උපරිම මට්ටමේ සිට පහළ යාමේ උපනතියක් දක්වමින් පැවති පොල් නිෂ්පාදනය සඳහා වූ පොහොර නිකුත් කිරීම 1983 දී මෙට්‍රික් ටොන් 35,670 දක්වා සියයට 18 කින් වැඩි විය. කෙසේ වුව ද, මෙම ප්‍රමාණය තවමත් 1980 දී නිකුත්

කරන ලද ප්‍රමාණයෙන් සියයට 64 ක් පමණි. ඉකුත් වසරේ අදාළ කාලච්ඡේදයන් හා සසඳන කල වර්ෂයේ මුල් භාගයේදී පොහොර නිකුත් කිරීම සියයට 9 කින් පහත වැටුණු අතර, දෙවන භාගයේදී සියයට 34 කින් කැපී පෙනෙන පරිදි වැඩිවී ඇත. පොහොර නිකුත් කිරීම සම්බන්ධ-යෙන් වූ මෙම රටාව තුළින් දක්වෙන්නේ වර්ෂයේ දෙවන භාගයේ පොල් මිළ ගණන් සැලකිය යුතු පරිදි වැඩිවීම හා වර්ෂයේ තුන්වන කාර්තුව අග භාගයේ සහ හතරවන කාර්තුව තුළ පැවති යහපත් කාලගුණික තත්ත්වයන් පොහොර භාවිතය දිරි ගැන්වීම සඳහා හේතු වූ බවය.

## 1 . 14 සංඛ්‍යා සටහන
## පොල් නිෂ්පාදන සංඛ්‍යා 1981—1983

| ශීර්ෂය | ඒකකය | 1981 | 1982 | 1983 (අ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ආ) .. | ගෙඩි දශ ලක්ෂ | 2,258 | 2,521 | 2,313 |
| 1·1 කපාපු පොල් .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 276 | 286 | 296 |
| 1·2 පොල් තෙල් .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 605 | 820 | 619 |
| 1·3 කොප්පරා (ඈ) .. | ගෙඩි දශ ලක්ෂ (ඇ) | 10 | 19 | 19 |
| 1·4 ගෙඩි පොල් අපනයන (ඉ) .. | ගෙඩි දශ ලක්ෂ | 2 | 9 | 5 |
| 1·5 දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශ ලක්ෂ | 1,350 | 1,366 | 1,373 |
| 2. සාමාන්‍ය මිල | | | | |
| 2·1 කොළඹ .. | ගෙඩියකට රුපියල් | 1·80 | 1·60 | 2·25 |
| 2·2 අපනයන නැ. වි. ස. .. | ගෙඩියකට රුපියල් | 2·45 | 3·32 | 3·65 |
| 3. පොහොර නිකුතුව .. | මෙ. ටො. දහස් | 37·7 | 30·2 | 35·7 |
| 4. නිෂ්පාදන පිරිවැය .. | ගෙඩියකට රුපියල් | 0·55 | 0·57 | 0·90 |
| 5. නැවත වගාව/යටි වගාව (උ) .. | හෙක්ටයාර | 3,555 | 3,543 | 2,641 |
| 6. නව වගාව (උ) .. | හෙක්ටයාර | 5,259 | 5,291 | 3,394 |
| 7. අපනයන ඉපයුම් .. | රුපියල් දශ ලක්ෂ | 1,438 | 1,497 | 1,921 |
| | (විගැහි දශ ලක්ෂ) | (64) | (65) | (76) |
| 7·1 මද නිෂ්පාදනයන් (ඌ) .. | රුපියල් දශ ලක්ෂ | 1,011 | 1,003 | 1,409 |
| | (විගැහි දශ ලක්ෂ) | (45) | (44) | (56) |
| 7·2 අනෙකුත් නිෂ්පාදනයන් .. | රුපියල් දශ ලක්ෂ | 427 | 494 | 512 |
| | (විගැහි දශ ලක්ෂ) | (19) | (21) | (20) |
| 8. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (එ) .. | | 4·1 | 4·1 | 3·8 |

මූලයන්: පොල් සංවර්ධන අධිකාරිය;
පොල් වගා කිරීමේ මණ්ඩලය;
ජාතික පොහොර ලේකම් කාර්යාලය;
ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලිකයි.

(ආ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස්වීම් සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ.)

(ඇ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදා ගත් අනුපාතිකයන්

කපාපු පොල් මෙ. ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925

(ඈ) අපනයන පමණි.

(ඉ) දිගු කලක් සීමා කිරීමෙන් පසු ගෙඩි පොල් අපනයනය 1981 මැයි මස යළි ඇරඹුණු අතර 1983 දෙසැම්බර් මස පළමු දින සිට 31 වැනි දින දක්වා යළි අත්හිටුවන ලදී.

(ඊ) ඒක පුද්ගල ගෘහ පරිභෝජනය 1981 සහ 1982 වසරකට ගෙඩි 90 වශයෙන් ද 1983 වසරකට ගෙඩි 92 වශයෙන්ද ගණන් බලා ඇත. කර්මාන්ත අංශයෙන් ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුළත් නොවේ.

(උ) විස්තරාත්මක තොරතුරු ලබා ගත නොහැකි බැවින් හෙක්ටයාර 0·4 ට අඩු කුඩා පොල් ඉඩම්වල කරගෙන යනු ලබන වගා කටයුතු පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

(ඌ) 1983 අගෝස්තු 12 සිට 31 දක්වා පොල් තෙල් අපනයනය තාවකාලිකව අත්හිටුවන ලදී.

(එ) වගා කිරීම සහ සැකසුම් කටයුතුවල පමණි.

විශ්ව විද්‍යාලය,

ලංකා බැංකුව සහ මහජන බැංකුව මගින් පවත්වා ගෙන යන පොල් පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය සංඛ්‍යාව සහ ණය ප්‍රමාණය පහත වැටීමේ උපනතිය 1983 දී ද දිගටම පැවතිනි. මෙම බැංකු දෙක මගින් දෙන ලද මුළු ණය සංඛ්‍යාව 1982 දී 1,198 සිට 1983 දී 591 දක්වා සියයට 51 කින් පහත වැටුණු අතර, දෙන ලද මුළු ණය ප්‍රමාණය 1982 රුපියල් දශ ලක්ෂ 9.1 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 5.2 දක්වා සියයට 43 කින් පහත වැටුණි. මෙම අඩුවීම සඳහා බලපා ඇති කරුණු පිළිබඳව සොයා බැලීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් අධ්‍යයනයක් අරඹා ඇත. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය ප්‍රමාණය අඩුවීම මධ්‍යයේ පොල් නිෂ්පාදන අංශය සඳහා නිකුත් කරන ලද මුළු පොහොර ප්‍රමාණයේ වැඩිවීම තුළින් අදහස් වන්නේ මෙම වැඩිවීම සඳහා අවශ්‍ය අරමුදල් වර්ෂයේ දෙවන භාගය තුළ ඉහළ නිෂ්පාදන මිළ ගණන්වල ප්‍රතිඵලයක් වශයෙන් ලැබුණු ඉහළ ආදායම මගින් ලබාගත් බවය.

1983 දී නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය වැඩි වුව ද කලින් භාවිතා කරන ලද මට්ටම හා සසඳා බලන කල පොල් නිෂ්පාදන අංශයේ පොහොර භාවිතය තවමත් බෙහෙවින් පහළ මට්ටමක පවතී. පොල් වගාව සඳහා යෝග්‍ය යැයි සහතික කර ඇති ප්‍රමාණය අනුව ගණන් බලන ලද අවශ්‍ය මුළු පොහොර ප්‍රමාණය සලකා බැලීමේදී ද පොහොර භාවිතය බෙහෙවින් අඩු මට්ටමක පවතී. පොල් වගා කරුවන්ගෙන් වැඩි කොටසක් විසින් කිසිම පොහොර භාවිතයක් නොකෙරේ. කුඩා ඉඩම් හිමියන් සහ ගෙවතු බහුල වීමත්, පොහොර භාවිතයෙන් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වසර දෙකක පමණ කාලයක් බලා සිටීමට සිදු වීමත්, පොල් වගා කරුවන්ගේ පොහොර භාවිතය සඳහා වූ මෙම ආකල්පය පැහැදිලි කෙරෙන හේතූන් වශයෙන් දැක්විය හැක.

1980 වර්ෂයේ සිට දක්නට ලැබුණු පොල් වතුවල අන්තර් භෝග වගා කිරීමේ ශීඝ්‍ර අඩුවීම 1983 වර්ෂය තුළද දිගටම පැවතුණි. වර්ෂය තුළදී අන්තර් භෝග වගා කිරීම සඳහා යෙදවුණු පොල් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 179 ක් වූ අතර, එය ඉකුත් වසරේ අන්තර් භෝග වගා කල බිම් ප්‍රමාණයට වඩා සියයට 10 ක අඩු වීමකි. අන්තර් භෝග වගාවන් සඳහා වූ සහනාධාරයට නිෂ්පාදකයින් දක්වා ඇති සැළකිල්ල අල්පව ඇති අතර, එය ගතවූ වසර කිහිපය තුළදී පහත වැටී ඇත. අන්තර් වගාවන් මගින් වගා කරුවනට අතිරේක ආදයමක් ලබාගත හැකි වන හෙයින් හා ඉඩම් භාවිතයේ සූක්ෂම බව වැඩි වීම තුළින් ජාතික ආර්ථිකයට සැළකියයුතු වාසි ලබාගත හැකි වන හෙයින්ද, සහනාධාර යෝජනා ක්‍රමයම පමණක් නොව, පොල් වගා බිම්වල වාරිමාර්ග පහසුකම් දිරි ගැන්වීම වැනි වඩා සඵල උපක්‍රමයන් කර්මාන්තයට අත්‍යවශ්‍ය බැව් පෙනී යයි.

පොල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය අනුව සළකා බලන කල කඩිනමින් ඉටු කළයුතු කරුණක් වන්නේ පුනරුත්ථාපන කටයුතු කෙරේ වැඩි අවධානයක් දැක්වීමය. කෙසේ වුවද, අදළ වර්ෂය තුළදී පොල් කර්මාන්ත අංශයේ පුනරුත්ථාපන වැඩ පිළිවෙල ක්‍රියාත්මක වූයේ අඩු වේගයකිනි. වර්ෂය තුළදී හෙක්ටයාර 5,539 ක මුළු ඉඩම් ප්‍රමාණයක් පුනරුත්ථාපනය කරනු ලැබූ අතර, ඉකුත් වසර තුළ නිම කළ ප්‍රමාණය හා සසඳා බලන කල මෙය සියයට 50 ක අඩු වීමක් පෙන්නුම් කෙරේ. 1983 දී පුනරුත්ථාපන කටයුතු සඳහා ගෙවන ලද සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3.2 ක් විය. වර්ෂය තුළදී යටි වගාව සහ නැවත වගාව සඳහා යොදවනලද බිම් ප්‍රමාණය සියයට 25 කින් පහත වැටී හෙක්ටයාර 2,641 ක් විය. 1982 දී රුපියල් දශ ලක්ෂ 13 ක්වූ මෙම අරමුණ සඳහා ගෙවන ලද සහනාධාරය 1983 දී රුපියල් දශ ලක්ෂ 9.6 දක්වා අඩුවී ඇත. වර්ෂය තුළදී පොල් පුනරුත්ථාපන කටයුතු, යටි වගාව සහ නැවත වගා කිරීම් ආදිය සම්බන්ධයෙන් සාපේක්ෂ වශයෙන් වූ මෙම අයහපත් ක්‍රියාකාරීත්වය තුළින් වර්ෂයේ මුල් භාගයේ අඛණ්ඩව පැවති නියඟයෙහි බලපෑම පිළිබිඹු කෙරේ. නැවත වගා කිරීම සහ යටි වගා කටයුතුවල පහත වැටීම වැළැක්වීම සඳහා මෙම අරමුණු සඳහා දෙනු ලබන සහනාධාර ප්‍රමාණය 1983 නොවැම්බර් මාසයේදී හෙක්ටයාරයකට රුපියල් 7,400 සිට රුපියල් 12,000 දක්වා වැඩි කරනු ලැබීය. ඉකුත් වසරේ සියයට 1 ක සුළු ඉහළ යාමක් පෙන්නුම් කළ

41766

අළුතින් වගා කල බිම් ප්‍රමාණය 1983 දී සැළකිය යුතු පරිදි සියයට 36 කින් හෙවත් හෙක්ටයාර 3,394 ක් දක්වා අඩු විය. පොල් කර්මාන්තයේ දිගුකාලීන ආර්ථික පැවැත්ම සඳහා අළුතින් වගා කිරීම වැදගත් යැයි සැළකූ හෙයින් සහනාධාර ප්‍රමාණය 1983 නොවැම්බර් මාසයේදී හෙක්ටයාරයකට රුපියල් 8,650 සිට රුපියල් 11,500 දක්වා සියයට 34 කින් වැඩි කරන ලදී.

ඓතිහාසිකව සළකා බලන කලද පොල් කර්මාන්ත අංශයේ නැවත වගා සහ යටි වගා කටයුතු සම්බන්ධ ක්‍රියාකාරිත්වය යහපත්ව නොපැවතින. විනාශවන ගස් ගණන ඉහළ නැංවූ, අවදනම වැඩි කළ, එමෙන්ම නැවත වගාව හා යටි වගාවට ඇති සානුබලයන් හීනකරවූ නිරන්තර නියඟයන් හැරුණු කල, වර්ෂ පහේ සිට හය දක්වා තරම් දිගු වන ඵල දැරීමේ කාල-ච්ඡේදයද මෙම අයහපත් ක්‍රියාකාරිත්වයට බලපාන්නට ඇත. මේ අනුව සළකා බලන කල සහනාධාරයට අමතරව නියඟයට ඔරොත්තු දිය හැකි සුළු කලකින් වැඩි ඵල දරන පැල වර්ගයක් වර්ධනය කිරීම, නැවත වගා කිරීමේ කටයුතු නංවාලීම සඳහා අවශ්‍ය වැදගත් පූර්ව කොන්දේසි-යක් වශයෙන් පෙනී යයි.

පොල්තෙල් කර්මාන්තය සැළකිල්ලට ලක් විය යුතු තවත් අංශයකි. මෙරට පොල්තෙල් මෝල් කර්මාන්තයේ ලක්ෂණයක් වන්නේ එය ඉතාමත් පැරණි යල් පැනපු යන්ත්‍ර වලින් යුත් කුඩා මෝල් රාශියකින් සහ විශාල මෝල් කිහිපයකින් සමන්විත වීමය. දැනට භාවිතයේ පවතින මිරිකීමේ යන්ත්‍ර වලින් වැඩි කොටසක් වයස අවුරුදු 50–60 වඩා වැඩි යැයි වාර්තා වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් තෙල් උකහා ගැනීම කාර්යක්ෂමව සිදු නොවන අතර, පුන්නක්කුවල ඉතිරිවන තෙල් ප්‍රමාණය සියයට 13 ක් පමණ වේ යැයි ගණන් බලා ඇත. වැඩි පීඩනයක් සහිත මිරිකීමේ යන්ත්‍ර යෙදවීම මගින් සහ නියමාකාරව යන්ත්‍ර නඩත්තු කිරීම මගින් පුන්නක්කුවල ඉතිරිවන තෙල් ප්‍රමාණය සියයට 6–8 අතර ප්‍රමාණයකට අඩු කරගත හැකිය. ඉන් තෙල් නිෂ්පාදනය වැඩි වන අතර, පුන්නක්කුවල කල් තබාගත හැකි භාවයද දියුණු කළ හැකිය. මෙම වාසි අනුව සළකා බලන කල තෙල් උකහා ගැනීමේ නව තාක්ෂණක්‍රමවල ආයෝජනය කිරීම කෙරේ වැඩි අවධානයක් දැක්වීම වැදගත්ය.

හෙක්ටයාර 451,000 ක් වශයෙන් ගණන් බලා ඇති පොල් වගාව සඳහා යෙදවී ඇති මුළු බිම් ප්‍රමාණය දළ වශයෙන් තේ හෝ රබර් වගාව සඳහා යෙදවී ඇති මුළු බිම් ප්‍රමාණය මෙන් දෙගුණයකි. කෙසේ වුවද, තේ හෝ රබර් අංශයන් සමග සසඳා බලන කල පොල් වගාව මගින් ජාතික ආර්ථිකයට කරනු ලබන දායකවීම ප්‍රමාණානුකූල නොවන්නේ එක් අතකට ඉඩම් භාවිතා කරන ආකාරයේ අකාර්යක්ෂම බව නිසාත්, අනික් අතට වගා ක්‍රම විධිමත්ව අනුගමනය නොකිරීමත් නිසාය. මෙය ඉඩමේ පදිංචිව නොසිට වගා කටයුතු කිරීමේ ඉඩම් භුක්ති ක්‍රමය, ගෙවතු වගාවන් බහුලව පැවතීම සහ මුළු ඉඩම් ප්‍රමාණයෙන් වැඩි කොටසක් ඉතා කුඩා බිම් කැබලි වීම යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

පොල් වගා අංශයේ සංවර්ධනය සඳහා මිල ප්‍රතිපත්තියට, වැදගත්, සමහරවිට ඉතාමත් වැදගත්, මෙහෙයක් ඉටු කිරීමට ඇත. මෙම අංශයේ මිල ප්‍රතිපත්තිය පදනම් විය යුත්තේ වගා කරුවනට ඔවුන්ගේ ආයෝජනයට සරිලන සාධාරණ ආදායමක් ලැබිය යුතුය යන මූලික සංකල්පය මතය. පොල් ගෙඩි සඳහා වගා කරුවන් අතට ලැබෙන මිල ප්‍රමාණවත් නොවුව-හොත් අමතර පිරිවැයක් දැරීමට සිදුවන පොහොර භාවිතය ඇතුළුව විධිමත් වගා ක්‍රම අනුගමනය කිරීමට ඔවුන් පෙළඹවීම අසීරු කරුණක් වනු ඇත. කාළගුණික තත්ත්වයන් යහපත්ව පවතී නම් වඩා යහපත් මිළ ගණන් පොහොර භාවිතය කෙරේ සැළකිය යුතු අයුරින් බලපාන බැව් 1983 දෙවන භාගයේ අත්දැකීම තුළින් පැහැදිලිවම පිළිබිඹු වේ.

කෙසේ වුවද, කරුණු කිහිපයක් නිසා වගා කරුවනට සාධාරණ මිලක් ලබාදීම අසීරු කාර්‍යයකි. ගෙඩි වෙළඳපලේ පවතින සමහර අපූර්ණතාවයන් මගින් වගා කරුවන්ගේ කේවල් ශක්තිය අඩු කර තිබීම එක් කරුණකි. අනෙක් කරුණ වන්නේ ගෙඩි නිෂ්පාදනයෙන් සියයට

75 ක් පමණ දේශීයව පරිභෝජනය කරනු ලබන හෙයින් පාරිභෝගිකයින් සහ වගා කරුවන්-ගේ අවශ්‍යතාවයන් අතර පවතින ගැටුමයි. නමුත් සාධාරණ මට්ටමක ඉහළ ගෙඩි මිලක් පවත්වාගෙන යාම කර්මාන්තයේ දිගුකාලීන ආර්ථික ශක්‍යතාව සම්බන්ධයෙන් සුවිශේෂ වැදගත් කමකින් යුතු වේ. ඒ සමගම ජාත්‍යන්තරව වාසිදයක මිළ ගණන් පවතින අවස්ථා-වන්හිදී පොල් නිෂ්පාදනයන් අපනයනය කිරීම සඳහා ඇති දිරි ගැන්වීම් නැංවීම සහ පවත්වා ගෙන යාම වැදගත් වන්නේ ශ්‍රී ලංකාව වැනි ආනයන අපනයන ආර්ථිකයන් සඳහා ඉහළ අපනයන ඉපැයුම් ඉතාමත් වැදගත් වන හෙයිනි.

### සුළු අපනයන භෝග

මූලික වශයෙන්ම අපනයනය සඳහා නිෂ්පාදනය කරන භෝග ගණනාවක් සුළු අපනයන භෝග අංශයට අයත්වේ. තේ, රබර් සහ පොල් යන ප්‍රධාන කෘෂිකාර්මික අපනයන භෝගයන් සමග සැසඳීමේදී මෙම අංශයට අයත් වන සැම භෝගයන් මගින්ම මුළු අපනයන ඉපයීම්වලට දයක වන ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් සුළුවේ. සමහරවිට කුරුඳු සහ කරදමුංගු හැරුණුවිට මෙම භෝගයන්ගෙන් බොහොමයක් වගා කරනු ලබන්නේ ' මිශ්‍ර වගා ' හෝ ' ගෙවතු වගා ' ලෙස කුඩා ඉඩම් කැබලි වලය. වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය හෝ ඒවායේ නිෂ්පාදනයන් සම්බන්ධයෙන් විශ්වාසදයක දත්තයන් තවමත් හිඟය. එමනිසා, සුළු අපනයන භෝග අංශයේ සංවර්ධනයන් පිළිබඳව පරීක්ෂා කරනු ලබන්නේ අපනයන පරිමාවේ හැසිරීම මගිනි. මෙම භෝගයන්ගේ නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයන කරනු ලැබේය යන උපකල්පනය මෙයට පදනම් වී ඇත.

කරාබුනැටි සහ කජු අපනයන පරිමාව පිළිවෙලින් සියයට 79 ක් සහ සියයට 46 ක සැළකිය යුතු වැඩි වීම ඒවායේ නිෂ්පාදනය 1983 වර්ෂය තුළ බෙහෙවින් වැඩි වූ බව පෙන්නුම් කරයි. කොකෝවා නිෂ්පාදනය සහ කෝපි අපනයන පරිමාවේ වැඩි වීමද වර්ෂය තුළදී ඒවායේ නිෂ්පාදනයේ වැඩි වීමක් පෙන්නුම් කරයි. කෙසේ වුවද මෙම කාණ්ඩය යටතට ගැනෙන වෙනත් වැදගත් භෝගයන් තුනක් වන තල, කුරුඳු සහ කරදමුංගු අපනයන පරිමාවේ කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කරනු ලැබිය. තම ගෙවුම් ශේෂයේ දැඩි දුෂ්කරතාවයන් සහ කුරුඳු වලට පූර්ණ ආදේශකයකට ආසන්න වඩා ලාභදයී නිෂ්පාදනයක් වන 'කැසියා ' ලබා ගත හැකි වීම නිසා ප්‍රධාන කුරුඳු ආනයනයකු වන මෙක්සිකෝව 1983 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලබන කුරුඳු ප්‍රමාණය තවදුරටත් අඩු කරනු ලැබීය. අපනයන වෙළඳපල තත්ත්වයන් මෙලෙස තවදුරටත් පිරිහීම මෑත කාලයේදී නිෂ්පාදනය සම්බන්ධයෙන් සැළකිය යුතු අවාසිදයක බලපෑමක් ඇති කරනු ලැබීය. 1983 වර්ෂය තුළදී සුළු අපනයන භෝග අංශයේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය බෙහෙවින් අසමාන විය. නමුත් සමස්ත වශයෙන් ගත් කල පූර්ව වර්ෂයට වඩා යහපත් තත්ත්වයක පැවතිණ.

සුළු අපනයන භෝග ආධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සහ අළුතින් වගා කිරීම සම්බන්ධ ක්‍රියාකාරිත්වය වර්ෂය තුළදී බලාපොරොත්තු කඩ කරවන සුළු විය. නැවත වගා කළ සහ අළුතින් වගා කළ බිම් ප්‍රමාණය 1983 දී සියයට 62 කින් හෙක්ටයාර 904 දක්වා අඩු විය. මෙය බොහෝදුරට වගා කටයුතු කෙරෙහි වර්ෂයේ වැඩි කාලයක් තුළ බලපැවැත්වූ නියං තත්ත්වයන්ගේ අවාසිදයක බලපෑම පිළිබිඹු කරයි. එසේම අපනයන අංශයේ ඇති වූ අස්ථායී-තාවයන්ද එමගින් තරමක්දුරට පිළිබිඹු වේ. මෙම ආධාර ක්‍රමය යටතේ ගෙවනු ලැබූ සහනා-ධාර ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 6.9 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 6.2 දක්වා අඩු විය. මෙම ප්‍රමාණයෙන් සියයට 37 ක් ගෙවතුවල මිශ්‍ර වගාවන් සඳහා දෙනු ලැබූ ආධාර වීම සඳහන් කළයුතු වැදගත් කරුණකි. 1983 දී අක්කර 5 දක්වා වන ඉඩම් කැබලි ' ගෙවතු මිශ්‍ර වගා ' සඳහා සහනාධාර ලැබීමට සුදුසුකම් ලබන බව ප්‍රකාශ කරන ලදී. මීට පෙර මෙම සහනාධාරය සඳහා සුදුසුකම් ලැබුවේ අක්කර භාගය දක්වා වන ඉඩම් කැබලි පමණි.

පොල් සහ රබර් ඉඩම්වලද ආර්ථික නොවන තේ ඉඩම්වලද සුළු අපනයන භෝග ගණනාවක් ව්‍යාප්ත කිරීම උදෙසා සැළකිය යුතු හැකියාවන් ඇති බව නැවත නැවතත් සඳහන් කිරීම වැදගත්ය. නමුත් මෙම හැකියාව මුදුන් පමුණුවා ගැනීම උදෙසා අපනයන මිළයන්ගේ කෙටි කාලීන උච්චාවචනයන්ගෙන් වගා කරුවන් ආරක්ෂා කිරීම උදෙසා පියවර ගැනීම වැදගත් වන බව පෙනෙන්නට ඇත. මෙම අංශය වැඩි දියුණු කිරීමට වඩාත් ගතික කාර්යභාරයක් ඉටු කිරීම උදෙසා ණය පහසුකම්, ව්‍යාප්ති සේවාවන් සහ අලෙවි මධ්‍යස්ථානවලට කිට්ටු සම්බන්ධතාවයන් ඇති රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ වතු වඩාත් වාසිදයක තත්ත්වයක ඇත.

**වී**

අයහපත් කාලගුණික තත්ත්වය හේතුකොටගෙන 1982 වගා වර්ෂයේදී අඩු වූ වී නිෂ්පාදනය 1983 වගාවර්ෂයේ දී වැඩි විය.* ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 1983 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.47 (වී බුසල් දශ ලක්ෂ 118.5 හෝ සහල් සමානය සහල් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.7) ක් ලෙස ගණන් බලා ඇත. මෙය ඉකුත් වසරේ නිෂ්පාදනයට වඩා සියයට 15 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. මෙම වර්ධනයට මූලික හේතුව වූයේ, වඩා දියුණු වගා ක්‍රම භාවිතය නිසා සාමාන්‍ය ඵලදාව වැඩි වීම සහ මහ කන්නයේදී වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩි වීමය. මුළු නිෂ්පාදනයෙන් තුනෙන් දෙකක පමණ ප්‍රමාණයකට වග කියනු ලබන මහ කන්නයේ නිෂ්පාදනය කෙරෙහි වර්ෂයේ මුල් භාගය තුළ පැවති නියඟය අහිතකර ලෙස බල නොපෑවේය.

1982/83 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.8 (වී බුසල් දශ ලක්ෂ 85) ලෙස ගණන් බලා ඇති අතර, එය නියඟයට හසු වූ ඉකුත් මහ කන්නයේ නිෂ්පාදනයට වඩා සියයට 31 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. සාමාන්‍ය වගා කන්නයක් ලෙස සැළකිය හැකි 1980/81 මහ කන්නය සමඟ සැසඳීමේදී එය සියයට 17 ක වැඩි වීමකි. මෙය මෙතෙක් මහ කන්නයකදී ලබා ගන්නා ලද වැඩිම නිෂ්පාදනයයි. එසේ වුවද, 1983 යල කන්නයේ නිෂ්පාදනය පසුගිය යල කන්නයට වඩා සියයට 13 කින් පහත වැටී ඇත. 1983 යල කන්නයේ නිෂ්පාදනයේ කැපී පෙනෙන පහත වැටීමට හේතු වූයේ අවුරුද්දේ මුල් භාගයේ පැවති නියඟය නිසා වගා කලහැකි බිම් ප්‍රමාණයක වගාව අත හැර දැමීම හෝ අස්වැන්න විනාශ වීමය. යල කන්නයේ වගාවට බලපාමින් ප්‍රධාන වැව්වල ජල මට්ටම බෙහෙවින් අඩු විය. යල කන්නයේ වගාව යටතට ගනු ලැබූ බිම් ප්‍රමාණය සියයට 13 කට වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටුණු බව තාවකාලික දත්තයන් පෙන්නුම් කරයි.

හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව 1982 වර්ෂයේදී කිලෝ ග්‍රෑම් 3,260 (බුසල් 156) සිට 1983 වසරේදී කිලෝ ග්‍රෑම් 3,595 (බුසල් 172) දක්වා වැඩි වූ බවට ගණන් බලා ඇත. සියයට 10 ක් හෙවත් හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 331 ක මෙම වැඩි වීම, සැළකිය යුතු දියුණුවක් වන අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මහ කන්නයේ වාර්තා වූ දියුණුවයි. ඉකුත් මහ කන්නය හා සැසඳීමේදී 1982/83 මහ කන්නයේ සාමාන්‍ය පලදාව සමස්තයක් වශයෙන් ගත් කල කිලෝ ග්‍රෑම් 488 (හෝ සියයට 15) කින් වැඩි විය. මෙම කන්නයේදී ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ ඇති බිම්වල සාමාන්‍ය පලදාවේ සියයට 19 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්වීය. ඉකුත් මහ කන්නය සමඟ සසඳන කල සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වූ සහ වර්ෂාපෝෂිත ප්‍රදේශවල, සාමාන්‍ය පලදාව පිළිවෙලින් සියයට 12 කින් සහ සියයට 10 කින් වැඩි විය. ඉකුත් මහ කන්නය සමඟ සැසඳීමේදී, මෙම මහ කන්නය සඳහා නිකුත් කල පොහොර ප්‍රමාණය සියයට 28 කින් වැඩි වීම සාමාන්‍ය පලදාවේ මෙම වැඩි වීම පැහැදිලි කරයි. නියඟ තත්ත්වයන් පැවතුනද යල කන්නයේ සාමාන්‍ය පලදාව ඉකුත් වසරට වඩා සියයට 7 ක වැඩි වීමක් වාර්තා කර ඇත.

---

* 1982 වගා වර්ෂය ලෙස ගණන් ගනු ලබන්නේ 1981/82 මහ සහ 1983 යල කන්නයන්ය.

## 1 . 15 සංඛ්‍යා සටහන
## වී සංඛ්‍යා 1982 – 1983

| ශීර්ෂය | ඒකකය | 1982 | | | 1983(අ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 568 | 277 | 845 | 583 | 242 | 825 |
| පොහොර නිකුතුව (ආ) .. | මෙට්‍රික් ටොන් දහස් | 92 | 49 | 141 | 118 | 42 | 160 |
| දෙන ලද ණය ප්‍රමාණය .. | රුපියල් දශ ලක්ෂ | 100 | 22 | 122 | 119 | 26 | 145 |
| වැඩි දියුණු කළ වී වර්ග යටතේ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 515 | 248 | 763 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| අස්වැන්න නෙළන ලද දළ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 479 | 268 | 747 | 558 | 219 | 777 |
| හෙක්ටයාරයක පලදාව (ඇ) .. | කිලෝග්‍රෑම් | 3,150 | 3,332 | 3,260 | 3,638 | 3,556 | 3,595 |
| අස්වැන්න නෙළන ලද ශුද්ධ බිම් ප්‍රමාණය .. | හෙක්ටයාර දහස් | 424 | 237 | 661 | 495 | 194 | 689 |
| නිෂ්පාදනය .. | මෙට්‍රික් ටොන් දහස් | 1,363 | 793 | 2,156 | 1,786 | 691 | 2,477 |
| සහතික මිළ ක්‍රමය යටතේ මිලදී ගැනීම් (ඈ) .. | ,, | 71 | 13 | 84 | 313 | 11 | 324 |
| ආනයන (වී සමානය) .. | ,, | — | — | 229 | — | — | 176 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව;
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය;
කෘෂිකර්ම සංවර්ධනය හා පර්යේෂණ අමාත්‍යාංශය;
වී අලෙවි මණ්ඩලය;
ලංකා පොහොර සංස්ථාව;
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.

(අ) තාවකාලික.

(ආ) පොහොර නිකුත් කිරීම, වගා වර්ෂය තුල සහ ලිත් වර්ෂය තුළදී එකිනෙකට වෙනස් වේ. ලිත් වර්ෂය ගණන් ගැනෙනුයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වාය. වගා වර්ෂය මහ (සැප්තැම්බර්/ඔක්තෝබර් — මාර්තු/අප්‍රේල්) යල, (අප්‍රේල්/මැයි—අගෝස්තු/සැප්තැම්බර්) කන්නවලින් යුක්ත වේ.

(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොටගත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව ගණනය කරන ලදී. මුළු වී නිෂ්පාදනය අස්වනු නෙළා ගත් ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය පලදාව ගණනය කරන ලදී.

(ඈ) මහ කන්නයේ අස්වැන්න ජනවාරි—ජූලි කාලච්ඡේදය තුළදී මිලදී ගත් අතර, යල කන්නයේ අස්වැන්න අගෝස්තු—දෙසැම්බර් කාලච්ඡේදය තුළ මිළදී ගන්නා ලදී.

ඉකුත් වසර සමග සැසඳීමේදී 1983 වර්ෂය තුළදී වපුරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 19,715 (සියයට 2) කින් අඩු විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ 1983 යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 13 කින් අඩු වීමයි. 1982–83 මහ කන්නයේදී, ප්‍රධාන වාරිමාර්ග සහ සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වගා කරන ලද දළ බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 5,115 (සියයට 2) කින් සහ හෙක්ටයාර 6,080 (සියයට 5) කින් වැඩි විය. මෙම වැඩි වීම් මහ කන්නයේ නිෂ්පාදනයේ වැඩි වීමට සැළකිය යුතු ලෙස උපකාරී විය. වර්ෂාපෝෂිත ප්‍රදේශයන්හී වගා කරන ලද දළ බිම් ප්‍රමාණයද සියයට 2 කින් වැඩි විය. 1983 වර්ෂයේදී වැපුරූ සහ අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය අතර වෙනස හෙක්ටයාර 47,484 හෝ සියයට 6 කි. ඉකුත් වසරේදී මෙය හෙක්ටයාර 98,650 ක් හෝ සියයට 12 ක් විය. කන්න දෙක වෙන වෙනම ගත් කල, 1982/83 මහ කන්නයේදී මෙම වෙනස හෙක්ටයාර 25,347 (වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 4) ක් වූ අතර, යල කන්නයේදී හෙක්ටයාර 22,137 (වපුරන ලද බිම් ප්‍රමාණයෙන් සියයට 9) ක් විය.

වී වගා අංශය සඳහා 1983 වගා වර්ෂය තුළ නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 18,555 කින් වැඩි විය. ඉකුත් වගා වර්ෂය හා සසඳන විට මෙය සියයට 13 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 1982/83 මහ කන්නය තුළදී පොහොර නිකුතුව සියයට 28 කින්

වැඩි විය. එසේ වුවද, යල කන්නයේදී පොහොර නිකුතුව සියයට 14 කින් පහත වැටුන අතර, වගාවට අහිතකර ලෙස බලපෑ නියඟය මෙයට ප්‍රධාන හේතුව විය. 1983 මැයි මාසයේදී පොහොර මිළ වැඩි කිරීමද යල කන්නයේ පොහොර නිකුතුවට බලපෑමක් ඇති කළේය. වපුරන ලද හෙක්ටයාරයක් සඳහා නිකුත් කරන ලද සාමාන්‍ය පොහොර ප්‍රමාණය 1981/82 මහ කන්නයේදී කිලෝ ග්‍රෑම් 162 සිට 1982–83 මහ කන්නයේදී කිලෝ ග්‍රෑම් 202 දක්වා සියයට 25 කින් වැඩි වුන අතර යල කන්නය සම්බන්ධයෙන් එම සංඛ්‍යාව 1982 දී කිලෝ ග්‍රෑම් 177 සිට 1983 දී කිලෝ ග්‍රෑම් 174 දක්වා සියයට 2 ක සුළු ප්‍රමාණයකින් අඩු විය.

1983 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලය විසින් සහතික මිළ ක්‍රමය යටතේ මිළදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,23,887 (බුසල් දශ ලක්ෂ 16) ක් විය. මෙය පසුගිය වසරේ මිළදී ගත් ප්‍රමාණය හා සසඳන විට දළ වශයෙන් සිව් ගුණයක වැඩි වීමක් වූ අතර, ඉකුත් සිව් වසර තුළ මිළදී ගැනීම් ප්‍රමාණයේ දක්නට ලැබුන අඩු වීමේ උපනතිය ආපසු හැරීමකි. මේ දක්වා වී මිළදී ගැනීමේදී වී අලෙවි මණ්ඩලය සමඟ තියුණු ලෙස තරඟ කළ පෞද්ගලික අංශයට, විශේෂයෙන්ම 1983 වර්ෂයේ මුල් භාගය තුළදී ඒ පරිදිම ක්‍රියාකාරීවීම සාපේක්ෂ වශයෙන් එතරම් ලාභදායි නොවූ බව පෙනේ.

1983 මාර්තු මාසයේදී සහතික මිළ රු. 57.50 සිට රු. 62.50 දක්වා වැඩි කරන ලදී. ඉකුත් වසරේදී මෙන්ම, විවෘත වෙළඳපලේ මිළ සහතික මිළට ඉහළින් පැවතියද, 1983 වර්ෂයේ මුල් භාගය ඉකුත් වසරේ සමකාලච්ඡේදය හා සසඳන විට, විවෘත වෙළෙඳපොලේ මිළත්, සහතික මිළත් අතර වූ පරතරය අඩු විය. 1983 ප්‍රථම සහ දෙවන භාගයන්හිදී විවෘත වෙළෙඳ පොලේ සාමාන්‍ය වී මිළ පිළිවෙලින් රු. 71.00 සහ රුපියල් 79.00 ලෙස ගණන් බලා ඇත. දෙවන භාගයේදී විවෘත වෙළඳපලේ මිළ සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීම යල අස්වැන්නේ ඌනතාවය පිළිබිඹු කරයි. ඉහත දැක්වූ අඩු පරතරය හැරුණුවිට දීර්ඝ කාලයක් තුළ තොග රැස් කර තබා ගැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදුවීමද වර්ෂයේ මුල් භාගය තුළ පෞද්ගලික අංශයේ වී මිළදී ගැනීමේ ක්‍රියාවලිය අඩු වීමට දායක වන්නට ඇත.

පෙර වසරේදී මෙන්ම, වී අලෙවි මණ්ඩලය විසින් වී මිළදී ගත් ප්‍රමාණයන්ගෙන් වැඩි කොටසක් (සියයට 93) ගෙන ඇත්තේ අම්පාර, පොළොන්නරුව සහ අනුරාධපුර යන වියළි කලාපීය දිස්ත්‍රික්ක වලිනි. වී මිළදී ගැනීම සම්බන්ධයෙන් දක්නට ලැබුන තවත් වැදගත් කරුණක් නම්, වර්ෂයේ දෙවන භාගයේදී මිළදී ගෙන ඇත්තේ මුළු මිළදී ගැනීම් වලින් සියයට 3 ක් පමණක් වීමය. පසුගිය වසරේ එම කාලය තුළ වර්ෂයේ මුළු මිළදී ගැනීම් වලින් සියයට 16 ක් සිදු කරන ලදී. 1983 යල කන්නයේ අස්වැන්න අඩු වීමද වී මිළදී ගැනීම් අඩු වීමට තරමක්දුරට හේතු විය.

අවුරුද්දේ දෙවන භාගයේදී වී මිළදී ගැනීමේ ප්‍රතිපත්තියෙහි ඇති කරන ලද කැපී පෙනෙන වෙනස්කම්ද මෙම මිළදී ගැනීමෙහි අඩු වීමට තවත් හේතුවක් විය. ජාතික ආහාර ප්‍රතිපත්ති කමිටුවෙහි යෝජනාවකට අනුකූලව, වී අලෙවි මණ්ඩලය, සමුපකාර සහ කෘෂි සේවා මධ්‍යස්ථාන හැර ගොවීන්ගෙන් සහ පුද්ගලික නියෝජිතයන්ගෙන් කෙලින්ම වී මිළදී ගැනීම අඩු කරන ලදී. වී අලෙවි මණ්ඩලයට ලාභයක් ඇතිව විකිණීමට නොහැකිව වී තොග ගොඩ ගැසී තිබීමත්, කෙලින්ම වී මිළදී ගැනීමේදී ගොවිපල මට්ටමේදීම දැරීමට සිදු වන ඒකක පිරිවැය (බුසලකට රුපියල් 71 ක් පමණ) අධික වීමත් මෙම ප්‍රතිපත්තිමය වෙනස ඇති කිරීමට තුඩු දුන් ප්‍රධාන හේතු විය. 1983 මැද භාගයේ සිට වී මිළදී ගැනීමේ කටයුතුවලදී වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අඩු වීමද පෞද්ගලික අංශය එම ක්‍රියාවලියෙහි වැඩි වැඩියෙන් නිරත වීමට හේතු විය.

ආරක්ෂක තොග රැස් කිරීමේ නියෝජිත ආයතනයක් වශයෙන් සිය කාර්යය සපුරාලීම සඳහා අවශ්‍ය වී තොග ලබා ගත නොහැකි වූ අවස්ථාවලදී හැර පෞද්ගලික අංශය සමග තරඟකාරී ලෙස වී මිළදී ගැනීම සඳහා දැඩි ලෙස උත්සාහ දැරීමක් වී අලෙවි මණ්ඩලයෙන් අපේක්ෂා නොකෙරේ. ආරක්ෂක තොග නියෝජිත ආයතනයක් ලෙස කාර්යක්ෂමව කටයුතු කිරීමට වී අලෙවි මණ්ඩලයට හැකි වීමට නම්, වී අලෙවි මණ්ඩලයේ සහ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කටයුතු ඒකාබද්ධ අධිකාරයක් යටතේ සම්බන්ධීකරණය කිරීම ඉතා ඉක්මනින් කළයුතුව ඇති අත්‍යවශ්‍ය කාර්යයකි. අවුරුද්දේ මුළුල්ලේ ලාභදායී අලෙවියක් නොමැතිව වී අලෙවි මණ්ඩලයේ වී තොග විශාල ලෙස එකතු වීම බොහෝ දුරට වී අලෙවි මණ්ඩලයත්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවත් අතර පවතින අතිශයින්ම දුර්වල සම්බන්ධතාවයන්හි ප්‍රතිඵලයකි. එබැවින්, මෙම ආයතන දෙකෙහි කටයුතුවල සම්බන්ධීකරණයක් ඇති කිරීමේ ප්‍රබල අවශ්‍යතාවය ගැන නැවත වරක් සඳහන් කළයුතුව ඇත.

වී නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටමක් කරා ළඟා වෙමින් පවතින හෙයින්, සහල් අපනයනය සඳහා ඇති අනාගත අපේක්ෂාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළයුතුව ඇත. මේ සම්බන්ධයෙන් විදේශ වෙළඳපල වලින් පිළි ගැනෙන සහල් වර්ග කෙරෙහි වැඩි සැළකිල්ලක් දැක්වීම අත්‍යවශ්‍ය බව පෙනේ. තවද, ආනයනය කරනු ලබන තිරිඟු පිටි පරිභෝජනය අඩු කරලීම පිණිස සාපේක්ෂ මිළයන්ගේ අදාළ වෙනස්කම් ඇති කිරීම මගින් තිරිඟු පිටි වෙනුවට හාල් පිටි ක්‍රමයෙන් ආදේශ කිරීම දිරි ගැන්වීමද පලදායී වනු ඇත.

**සීනි**

1983 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ සීනි නිෂ්පාදනය (ආහාර කොමසාරිස්ගෙන් මිළට ගත් අපතේ යන සීනි වලින් කල නිෂ්පාදනයන් හැර) මෙට්‍රික් ටොන් 21,508 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙය 1982 වසරේ නිෂ්පාදනය සමග සසඳන කල සියයට 6 ක අඩුවීමකි. හිඟුරාන කම්හලෙහි නිෂ්පාදනය සියයට 1 කින් සුළු වශයෙන් අඩු වූ අතර, කන්තලේ කම්හලෙහි නිෂ්පාදනය සියයට 11 කින් අඩු විය. කම්හල් දෙකෙහිම නිෂ්පාදනය අඩුවීමට හේතුව වූයේ සීනි සකස් කිරීමට අවශ්‍ය උක් දඬු සැපයුමේ අඩු වීමයි.

1983 වසරේදී හිඟුරාන කම්හලෙහි උක් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය (වගාකල බිම් ප්‍රමාණය සහ නිරි වගාව) සහ අස්වනු නෙළා ගත් බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 10 කින් සහ සියයට 9 කින් වැඩි විය. හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව සියයට 5 කින් අඩු වුවත් නෙළා ගත් උක් දඬු ප්‍රමාණය සියයට 3 කින් වැඩි විය. පූර්ව වර්ෂයේදී මෙන් නොව පෞද්ගලික අංශය මගින් සපයන ලද උක් දඬු ප්‍රමාණය සියයට 14 කින් සැළකිය යුතු ලෙස අඩු විය. 1983 වසරේදී ඔවුන් සැපයූ ප්‍රමාණය හිඟුරාන කම්හල මගින් නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට ගත් මුළු උක් දඬු ප්‍රමාණයෙන් සියයට 19 ක් වූ අතර, 1982 වසරේදී මෙයට අනුරූප ප්‍රතිශතය සියයට 22 ක් විය.

1983 වසරේදී කන්තලේ කම්හලෙහි උක් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය පසුගිය වසරේ මට්ටමේම වාගේ නොවෙනස්ව පැවතිනි. එසේ වුවද, අස්වනු නෙළා ගත් බිම් ප්‍රමාණය සියයට 8 කින් අඩු විය. හෙක්ටයාරයක සාමාන්‍ය පලදාව සියයට 4 කින් වැඩි විය. නමුත් එය අස්වනු නෙළා ගත් බිම් ප්‍රමාණයේ අඩුවීමෙන් උක් නිෂ්පාදනය කෙරේ ඇති වූ අවාසිදායක බලපෑම සමහන් කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ අතර, උක් නිෂ්පාදනය එය හේතුකොටගෙන සියයට 4 කින් අඩු විය. පෙර වර්ෂයන්හිදී මෙන්ම පෞද්ගලික අංශයෙන් මිළදී ගත් උක් දඬු ප්‍රමාණය ඉතා සුළු විය.

කම්හල් දෙකෙහිම සීනි ලබා ගැනීමේ ප්‍රතිශතයන් ප්‍රධාන සීනි නිෂ්පාදනය කරන රටවල එම ප්‍රතිශතයන්ට වඩා පහළ මට්ටමක පවතින අතර ඒවා 1983 දී අඩු විය. පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහි ද අවධාරණය කළ පරිදි කම්හල් දෙකෙහිම වගාව මෙන්ම නිෂ්පාදනය සම්බන්ධයෙන් ද කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා බොහෝ දුරට ඉඩකඩ ඇත.

රටෙහි සීනි නිෂ්පාදනය දැනට සම්පූර්ණයෙන්ම රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාරයකි. රජයට අයත් කම්හල් දෙක මගින් කරනු ලබන නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ රටෙහි මුළු අවශ්‍යතාවයන්ගෙන් සියයට 10 ක තරම් ප්‍රමාණයක් සපුරාලීමට පමණි. රාජ්‍ය අංශයේ සහභාගිත්වය වැඩි කිරීම තුළින් සහ පෞද්ගලික අංශයේ ආයෝජනයන් කර්මාන්තය තුළට ඇද ගැනීම තුලින්ද නිෂ්පාදනය වැඩි කිරීම උදෙසා පියවර කිපයක් ගෙන තිබේ. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මගින් මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල දිනකට උක් දඬු ටොන් 1,250 ක් ඇඹරීමේ මූලික ධාරිතාවක් ඇති (මෙය දිනකට උක් දඬු ටොන් 2,000 දක්වා ප්‍රසාරණය කිරීමට ඉඩකඩ ඇත) රජයට අයත් කම්හලක් ඉදිවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය රුපියල් දශ ලක්ෂ 1,228 ක (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 52 ක්) ඇස්තමේන්තුගත වියදමකින් යුක්තය. මින් රුපියල් දශ ලක්ෂ 798 ක්(එ.ජ. ඩොලර් දශ ලක්ෂ 34 ක්) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙනු ඇත. පෞද්ගලික ආයෝජනයන් පෙළඹවීමට රජය විසින් දෙනු ලැබූ සානුබලයන්ට ප්‍රතිචාරය දැක්වීමක් ලෙස අළුතින් උක් දඬු වගා කිරීම සඳහා සුදුසු රජයට අයත් ඉඩම් ලබා ගැනීමට ඇති මොනරාගල දිස්ත්‍රික්කයේ නව සීනි කම්හල් තුනක් ඉදි කිරීමට ජාත්‍යන්තර ආයතන තුනක් එකඟවී තිබේ. මේ මගින් නව තාක්ෂණය මෙන්ම මූල්‍ය සහභාගිත්වයද ලැබෙනු ඇත. මේ සැම ව්‍යාපෘතියකම වැදගත් ලක්ෂණය නම් උක් වගාව සඳහා කම්හලට අයත් මූලික වත්තට අතිරේකව කුඩා ඉඩම් අංශයක් ද ඇතුළත් වීමයි.

1983 දී ලෝක වෙළඳපොලේ සීනි මිළයන් සියයට 20 කින් පමණ අඩු විය. මුළු සීනි සැපයුමෙන් සියයට 90 ක් පමණ ආනයනය කරනු ලැබුවත් ජාත්‍යන්තර වෙළඳපොලේ මිල හැසිරීම් දේශීය මිළයන් මගින් පිළිබිඹු නොවීය. තීරු බදු ප්‍රතිපත්තිය දේශීය කර්මාන්තයට රැකවරණය සැළසීමටත් මෙම අංශයට අතිරේක ආයෝජන පොළඹවා ගැනීමටත් නිෂ්පාදන සානුබලයන් පවත්වා ගැනීමට අරමුණු කරගන්නක් විය.

මුළු පාරිභෝජන අවශ්‍යතාවයන්ගෙන් සියයට 10 ක් පමණක් නිෂ්පාදනය කරන දේශීය කර්මාන්තයන් සඳහා දෙනු ලැබ ඇති මෙම ආරක්ෂා මට්ටම යටතේ ඉහළ පලදායිතාවයකට නැංවීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්ද දැඩි වගකීමක් ඇත. සීනි සංයුක්ත මණ්ඩලය සතු වතුවල උක්දඬු නිෂ්පාදනයේ අඛණ්ඩ වර්ධනයක් පවත්වා ගෙන යාම උක් වගාව සඳහා පෞද්ගලික අංශයේ වැඩි සහභාගිත්වය සහ උක් දඬුවලින් සීනි ලබා ගැනීමේ අනුපාතය ඉහළ නැංවීම යන කරුණු සඳහා දේශීය සීනි නිෂ්පාදන කර්මාන්තය විසින් ඉහළ ප්‍රමුඛත්වයක් දිය යුතුව ඇත.

**අතුරු ආහාර භෝග**

අතුරු ආහාර භෝග අංශය සම්බන්ධයෙන් දත්තයන් හිඟය. ලබා ගත හැකි දත්තයන් දළ ඇස්තමේන්තු මත පදනම්ව ඇති නිසා වර්ෂයෙන් වර්ෂයට මෙම අංශයෙහි වන සංවර්ධනයන් විශ්ලේෂණය කිරීම අපහසුය. අතුරු ආහාර භෝග ගණනාවක්ම ගෙවතු වගාවන් සහ ඉතා කුඩා ඉඩම්වල මිශ්‍ර වගාවන් ලෙස කරගෙන යනු ලබන නිසා වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය හෝ නිෂ්පාදනය පිළිබඳව ක්‍රමවත් ලෙස තොරතුරු එක්රැස් කර ගැනීම අසීරු කාර්යයක් වී ඇත. එමනිසා මෙහි දක්වා ඇති විග්‍රහය විශ්වාස කටයුතු දත්තයන් ලබා ගැනීමට නොහැකිවීමේ දැඩි සීමාවට යටත් වේ.

රතු ළූනු, මුංඇට, උඳු, අර්තාපල් සහ කව්පි වගා කොට ඇති බිම් ප්‍රමාණය ඉකුත් වසර සමග සසඳන කල සැළකිය යුතු පරිදි වැඩිවූ බව තාවකාලික දත්තයන් පෙන්නුම් කරයි. අපනයනය කළ එළවළු ප්‍රමාණය ද 1983 වසර තුළදී විශාල වැඩිවීමක් වාර්තා කර ඇත. මෙම භෝගයන්ගේ බොහොමයක නිෂ්පාදනය වසර තුළදී වැඩි වන්නට ඇත. මෙම අංශය සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය සියයට 24 කින් වැඩි වීමද, මෙම නිගමනයට එළඹීමට සහාය වේ. එසේ වුවද මඤ්ඤොක්කා සහ බතල වගා කොට තිබූ බිම් ප්‍රමාණය සැළකිය යුතු ලෙස

අඩු වූ අතර, මිරිස් සහ තල වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය පසුගිය වසරේ මට්ටමේම වාගේ නොවෙනස්ව පැවතුනි. ඉකුත් වසරේදී සැළකිය යුතු ලෙස වැඩිවූ සෝයා බෝංචි වගා කොට තිබූ බිම් ප්‍රමාණයට එරෙහිව 1983 වසරේදී එය සියයට 18 කින් අඩුවී ඇති බව ඇස්තමේන්තු කොට තිබේ. ඉරිඟු වගාව යටතේ ඇති බිම් ප්‍රමාණයද සියයට දෙකකින් අඩුවූ බව ඇස්තමේන්තු කොට ඇත. එසේ වුවද, 1983 වසර තුළදී අලෙවි මණ්ඩලය මගින් පදනම් මිළ ක්‍රමය යටතේ මිළ දී ගත් සෝයා බෝංචි සහ ඉරිඟු ප්‍රමාණය බෙහෙවින් වැඩි විය. ජාත්‍යන්තර මිළ ගණන් අඩුවීමේ තත්ත්වයක් තිබියදීත් පදනම් මිළ ක්‍රමය යටතේ සෝයා බෝංචි සඳහා සතුටු දායක මිළක් ලැබීම වී අලෙවි මණ්ඩලය මගින් මිළදී ගත් සෝයා බෝංචි ප්‍රමාණයේ මෙම වැඩිවීමට හේතු වන්නට ඇත.

මහවැලි 'එච්' ප්‍රදේශයේ අතුරු ආහාර භෝග යටතේ ඇති බිම් ප්‍රමාණය විශේෂයෙන්ම මිරිස් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය, 1983 වසරේදී වැඩි විය. 1983 යල කන්නයේදී වී වගාව සඳහා ජලය හිඟකම බොහෝ ගොවීන් ජලය අඩුවෙන් අවශ්‍ය වන අතුරු ආහාර භෝග වගාව කරා යොමු කරවීය. එසේම මිරිස් සහ බොම්බයි ළූනු වැනි භෝගවල සාපේක්ෂ ලාභදායිතාව ඉහළ මට්ටමක පැවතීම ද ගොවීන් මෙම භෝග වගා කිරීමට උනන්දු කරවන්නට ඇත.

පසුගිය වසරේ වාර්ෂික වාර්තාවේද පෙන්වා දුන් පරිදි අතුරු ආහාර භෝගයන්හි පලදාව වැඩිකිරීම මගින් නිෂ්පාදනය වැඩි කිරීමට බොහෝ දුරට ඉඩකඩ ඇත. මෙතෙක් නිෂ්පාදනය වැඩිවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම වගා කොට ඇති බිම් ප්‍රමාණය වැඩිවීම හේතුකොටගෙනය. භෝගයන් විශාල සංඛ්‍යාවක දැනට ලැබෙන සාමාන්‍ය පලදාව ලබාගත හැකි පලදාවට වඩා බොහෝ අඩු මට්ටමක පවතින නිසා වඩා සූක්ෂම ලෙස මෙම භෝගයන් වගා කිරීම ඒවායේ පලදාව ඉහළ නැංවීම මගින් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමටත් හේතු වනු ඇත. එසේ වුව ද, වඩා දියුණු වගා ක්‍රම භාවිතය බොහෝ දුරට වඩා හොඳ ව්‍යාප්ති සේවාවන් , ණය සහ අලෙවි පහසුකම් මෙන්ම ලාභදායි මිළ ගණන් මතද රඳා පවතී.

පදනම් මිළ ක්‍රමය මේ වසර තුළදීත් අතුරු ආහාර භෝග 11 ක් සඳහා නොකඩවා ක්‍රියාත්මක වුනි. වී අලෙවි මණ්ඩලය, මින් භෝග අටක් සඳහා මෙම මිළදී ගැනීම් ක්‍රමයක් ක්‍රියාත්මක කලත්, මිළදී ගැනීම් ප්‍රමාණය වශයෙන් බැලීමේ දී වැදගත් වූයේ ඉරිඟු සහ සෝයා බෝංචි සම්බන්ධව පමණි. මිරිස්, රතු ළූනු සහ බොම්බයි ළූනු නිෂ්පාදකයන් ඔවුන්ගේ නිෂ්පාදනයන් පදනම් මිළට වඩා වැඩි මිළකට සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව සහ මාක්ෆෙඩ් වැනි ආයතනවලට අලෙවි කිරීමට සමත් විය. පදනම් මිළ ක්‍රමය අතුරු ආහාර භෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම කෙරෙහි වැදගත් කාර්ය භාරයක් ඉටු කර තිබෙන අතර විවෘත වෙළෙඳපොල මිළ ගණන් සහ ජාත්‍යන්තර මිළ ගණන් සමඟ සසඳන කල පදනම් මිළයන් බෙහෙවින් ඉහළ මට්ටමක පවත්වාගෙන ගියහොත් වී අලෙවි මණ්ඩලය මගින් කරන මිළ දී ගැනීම් වල අතිරික්තයක් ඇතිවීමට හේතු විය හැකිය. එසේම සමහර අතුරු ආහාර භෝග වගා කිරීම ධෛර්‍යමත් කරවන අපනයන ගම්මාන ඇතිකිරීම අතුරු ආහාර භෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ගත් වැදගත් පියවරක් බව පෙනේ.

**පොහොර**

1983 වර්ෂයේ මුළු පොහොර නිකුතුව 1982 වර්ෂයට වඩා මෙට්‍රික් ටොන් 25,700 කින් නැතහොත් සියයට 7 කින් වැඩි විය. ඉකුත් වසරේ දක්නට ලැබුණු තත්ත්වයට තරමක් වෙනස්ව, වී වගා අංශය සහ සුළු අපනයන භෝග වගා අංශය හැර අනෙකුත් සියළුම භෝග වගා අංශයනට නිකුත් කළ පොහොර ප්‍රමාණය වැඩි විය. මෙට්‍රික් ටොන් 12,800 ක් වූ විශාලතම වැඩිවීම තේ වගා අංශයෙහි වාර්තා වූ අතර, පොල් සහ රබර් වගා අංශයන්හි පිළිවෙලින් මෙට්‍රික් ටොන් 5,400 ක සහ මෙට්‍රික් ටොන් 2,000 ක වැඩිවීම් වාර්තා විය. අතුරු

ආහාර භෝග වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,200 කින් වැඩි වූ අතර, මීට එරෙහිව වී වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4,900 කින් පහත වැටිණි.

තදබල නියඟ තත්ත්වයක් පැවති වර්ෂයේ දෙවන කාර්තුව තුළදී තේ වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය තියුණු ලෙස පහත වැටුනු බව සංඛ්‍යා තොරතුරු කාර්තු අනුව ගෙන බලන කළ පෙනී යයි. එසේ වුව ද, දෙවන කාර්තුව තුළ පොහොර නිකුතුවේ අඩුවීම පමණටත් වඩා මකාලමින් අනෙකුත් කාර්තුවලදී පොහොර නිකුතුව වැඩි විය. තෙවැනි සහ සිව්වැනි කාර්තු තුළදී නිකුත් කළ පොහොර ප්‍රමාණයන් බෙහෙවින් වැඩිවීමට හේතු වූයේ යහපත් කාලගුණික තත්ත්වයන් සහ තේ සඳහා වූ වඩා හොඳ මිළ ගණන්ය. සියළුම කාර්තු තුළදී රබර් වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණයන් වැඩි වී ඇති අතර, විශාලතම වැඩිවීම දක්නට ලැබුනේ වර්ෂයේ සිව්වැනි කාර්තුව තුළදිය. පොල් වගා අංශයට නිකුත් කළ පොහොර ප්‍රමාණය වර්ෂයේ පළමු කාර්තුව තුළදී පහත වැටී, එම පහත වැටීම පමණටත් වඩා මකාලමින් දෙවන කාර්තුව තුළදී තියුණු ලෙස ඉහළ ගියේය. හිතකර කාලගුණික තත්ත්වය සහ පොල් සඳහා වඩා හොඳ මිළක් ලැබීම මෙම වැඩිවීමට හේතු විය. වී වගා අංශය සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය මුල් භාගය තුළදී සුළු වශයෙන් වැඩි වූ නමුදු, දෙවන භාගය තුළදී පහත වැටිණි. (මෙය පසුගිය වර්ෂයේදී ද දක්නට ලැබුණු ලක්ෂණයකි.) මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාර්ෂික පොහොර නිකුතුව බොහෝ දුරට 1982 වර්ෂයේ තත්ත්වයෙහිම පැවතිණි. 1983 වර්ෂය තුළ එක් එක් කාර්තු තුළදී විවිධ භෝග වගාවන් සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණයන් සමස්තයක් ලෙස ගෙන බලන කල බොහෝ දුරට එකිනෙකට වෙනස් රටාවක් පෙන්වයි. මෙයට බොහෝ දුරට හේතු වන්නට ඇත්තේ කාලගුණික තත්ත්වයන් විවිධ භෝගයනට විවිධ ආකාරයට බලපෑමය. 1983 මැයි මාසයේදී පොහොර වර්ග කිහිපයක මිළ වෙනස් වීම සහ මිළ වෙනස් කිරීම් ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ එක් එක් භෝග වගා අංශයන්හි වූ පොහොර තොග තත්ත්වයද කාර්තු අනුව පොහොර නිකුතුවෙහි මෙම විෂම බෙදී යාම කෙරෙහි බලපෑමක් ඇති කළා විය හැකිය.

**1 . 16 සංඛ්‍යා සටහන**

**භෝග අනුව පොහොර නිකුතුව 1980—1983**

මෙට්‍රික් ටොන් දහස්

| | 1980 | 1981 | 1982 | 1983(අ) |
|---|---|---|---|---|
| 1. වී .. | 190·0 | 155·6 | 167·1 | 162·2 |
| 2. තේ .. | 109·9 | 103·3 | 102·7 | 115·5 |
| 3. රබර් .. | 22·0 | 16·8 | 16·5 | 18·5 |
| 4. පොල් .. | 55·8 | 37·7 | 30·3 | 35·7 |
| 5. අතුරු ආහාර භෝග .. | — | 14·8 | 13·5 | 16·7 |
| 6. සුළු අපනයන භෝග .. | — | 4·2 | 2·3 | 2·1 |
| 7. වෙනත් .. | 62·0 (ආ) | 34·9 | 47·0 | 54·4 |
| එකතුව .. | 439·7 | 366·3 | 379·4 | 405·1 |

මූලයන්: ලංකා පොහොර සංස්ථාව;
ජාතික පොහොර ලේකම් කාර්යාලය.

(අ) තාවකාලික.

(ආ) අතුරු ආහාර භෝග සහ සුළු අපනයන භෝග වගා අංශයනට නිකුත් කළ පොහොර ප්‍රමාණයන් ඇතුළත්ය.

1982 වර්ෂය තුළදී නොවෙනස්ව පැවති පොහොර මිළ ගණන් ලෝක වෙළඳපලෙහි පොහොර මිළ වෙනස්වීම් සහ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් නිසා 1983 මැයි මාසයේ දී ප්‍රතිශෝධනය කරන ලදී. මෙම ප්‍රතිශෝධනය පොහොර සහනාධාරය, ඒ සඳහා අයවැයෙන් වෙන් කළ රුපියල් දශ ලක්ෂ 1,000 තුළ පවත්වා ගැනීමට දරූ ප්‍රයත්නයක් ද විය. සල්ෆේට් ඔෆ් ඇමෝනියා සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් මිළ පිළිවෙලින් සියයට 16 කින් සහ සියයට 5 කින් අඩු කරන ලදී. අනෙකුත් පොහොර වර්ග/මිශ්‍රණවල මිළ සියයට 2 (යූරියා) සිට සියයට 26 (එන්.පී.කේ.) දක්වා ප්‍රමාණයකින් වැඩි කරන ලදී. එසේ වුවද, 1982 වර්ෂය තුළදී විවිධ භෝග වගා අංශයන් සඳහා යෙදූ එක් එක් පොහොර වර්ගවල සාපේක්ෂ ප්‍රමාණයන් පදනම් කොටගෙන සකස් කළ බර තබන ලද සාමාන්‍ය මිළ ගණන් වලින් පෙනී යනුයේ, මෙම මිළ ප්‍රතිශෝධනය නිසා වී වගා අංශයෙහි පොහොර මිළ සියයට 5 කින් ඉහළ ගිය බවත්, තේ සහ පොල් වගා අංශයන්හි පොහොර මිළ පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 2 කින් පහත වැටුණු බවත්ය. තවද, වර්ෂය තුළදී වැව්ලි භෝග වර්ගවල මිළ සැළකිය යුතු ලෙස ඉහළ යාමද, වැව්ලි භෝග අංශයේ පොහොර භාවිතය කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළා විය හැකිය. තදබල නියඟය නොපැවතියේ නම්, වර්ෂය තුළදී වැව්ලි භෝග වගා අංශයට වඩා විශාල පොහොර ප්‍රමාණයක් ඇදී යන්නට ඉඩ තිබිණි.

රජයට අයිති සපුගස්කන්ද යූරියා කම්හලේ නිෂ්පාදනය 1982 වර්ෂය සමග සසඳන කල මෙට්‍රික් ටොන් 85,889 කින් (සියයට 41) තියුණු ලෙස පහත වැටිණි. නිරතුරුවම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිත වීම නිසා වර්ෂයේ මුල් භාගයේදී නිෂ්පාදනයට බාධා වීමත් , ඔක්තෝබර් මාසයේ සිට නොවැම්බර් මැද හරිය දක්වා නඩත්තු කාර්යයන් සඳහා කම්හල සම්පූර්ණයෙන්ම වසා තැබීමත් මෙම පහත වැටීමට මූලික වශයෙන් හේතු විය. එප්පාවල රොක් පොස්පේට් කම්හලෙහි 1983 වර්ෂය තුළ රොක් පොස්පේට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 15,726 ක් විය.

**1 . 17 සංඛ්‍යා සටහන**

**පොහොර මිළ ගණන්**

මෙට්‍රික් ටොන් එකක් රුපියල්

| වර්ගය | 1981—09—16 වැනි දින සිට බලපැවැත්වූ මිළ | 1983—05—04 වැනි දින සිට බලපැවැත්වූ මිළ |
|---|---|---|
| යූරියා .. | 2,785 | 2,850 |
| සල්පේට් ඔෆ් ඇමෝනියා .. | 4,270 | 3,600 |
| ට්‍රිපල් සුපර් පොස්පේට් .. | 2,685 | 2,850 |
| රොක් පොස්පේට් .. | 1,635 | 2,000 |
| එන්.පී.කේ. 5: 15: 15 .. | 2,785 | 3,500 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් .. | 2,900 | 2,750 |

මූලය: ජාතික පොහොර ලේකම් කාර්යාලය.

සටහන: 1982 වර්ෂය තුළදී මිළ ප්‍රතිශෝධනයක් නොවීය.

ප්‍රාදේශීය පොහොර ගබඩා සංකීර්ණ ගැන විශේෂයෙන් සළකන කල තොග වශයෙන් පොහොර බෙදා හැරීමෙහි සැළකිය යුතු දියුණුවක් පෙන්වා ඇත. පොළොන්නරුව පොහොර ගබඩා සංකීර්ණය සහ අනුරාධපුර ගබඩා සංකීර්ණය දැන් නිම වීමට ආසන්නය. ලබන වර්ෂය තුළදී මෙම ගබඩා සංකීර්ණ මගින් අදාළ ප්‍රදේශයනට පොහොර නිකුත් කිරීම අරඹනු ඇත. සිල්ලර වශයෙන් පොහොර බෙදා හැරීම දියුණු කිරීම සඳහා දේශීය සහ විදේශීය සහභාගිත්වය ඇතිව අරඹන ලද වැඩ කටයුතු 1983 වර්ෂයේදී මනා ප්‍රගතියක් පෙන්වීය. ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව දිවයිනේ විවිධ පළාත්වල සිල්ලර පොහොර ගබඩා ඉදිකිරීමේ කටයුතු වල ද හොඳ ප්‍රගතියක් ඇති විය. පොහොර බෙදා හැරීම සහ ගොවිපල මට්ටමේදී පොහොර ලබා ගැනීම කෙරේ මෙම ක්‍රියාමාර්ගයන් ඉතා ඉක්මනින් බලපා ඇත.

**ධීවර හා පශු නිෂ්පාදනය**

1983 වර්ෂයේදී මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,18,500 ක් ලෙස ධීවර අමාත්‍යාංශය විසින් තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර මෙය ඉකුත් වසරේ නිෂ්පාදනය සමඟ සසඳන-කළ සියයට 2 ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම වැඩි දියුණුව සියළුම අංශවලත් විශේෂයෙන්ම පසුගිය වසර හා සැසඳීමේදී සියයට 8 ක නිෂ්පාදනයේ වැඩිවීමක් වාර්තා කළ මිරිදිය ධීවර අංශයේත් දක්නට ලැබුණි. මෙම අංශයේ සංවර්ධනය උදෙසා ඇති ඉඩ ප්‍රස්ථා හේතු කොටගෙන පසු ගිය වසර දෙක තුළදී මිරිදිය ධීවර අංශය දියුණු කිරීම උදෙසා සැළකිය යුතු අවධානයක් යොමු කර තිබේ.

කෙසේ වුවද, දිවයිනේ මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 80 කට ආසන්න ප්‍රමාණයක් ලැබෙන වෙරළබඩ අංශයේ ක්‍රියාකාරිත්වය නොකඩවා දුර්වල තත්ත්වයක පැවති අතර එහි 1983 වර්ෂයේ නිෂ්පාදනය වැඩිවූයේ සියයට එකකටත් වඩා අඩු ප්‍රමාණයකිනි. 1983 වෙරළබඩ අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය 1979–83 පස් අවුරුදු ධීවර මහා සැලැස්මෙන් අපේක්ෂා කරන ලද ප්‍රමාණයට (මෙට්‍රික් ටොන් 216,000) වඩා සියයට 16 කින් අඩු විය. වෙරළබඩ අංශයේ මසුන් නිෂ්පාදනයෙන් සියයට 70 ක් පමණ යාන්ත්‍රික බෝට්ටු මගින් කෙරෙන නිසා ඉන්ධන මිළ ඉහළ යාම මෙම අංශයේ නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකළ බව පෙනී යයි. කෙසේ වුවද, මත්ස්‍ය නිෂ්පාදක මිළ ගණන්වල පෙනෙන්නට තිබෙන වැඩිවීමත් වයඹ වෙරළබඩ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සහ බටහිර වෙරළබඩ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය වැනි වෙරළබඩ ධීවර අංශයේ විශේෂ ව්‍යාපෘති කිහිපයක් යටතේ ආයෝජනය කරමින් පවතින විශාල අරමුදල් ප්‍රමාණයත් අනුව බලන විට, මෙම අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය විශාල වශයෙන් ඉන්ධන මිළ ඉහළ යාම මගින් පමණක් විස්තර කළ හැකි ද යන්න සැක සහිතය. වෙරළබඩ ධීවර අංශයේ නිෂ්පාදනයේ වර්ධනය සඳහා ඇති බාධක මගහරවා ගැනීමේ අරමුණ ඇතිව එකී බාධක ඉතා ඉක්මනින් හඳුනා ගැනීම වැදගත්ය.

අළුත් බෝට්ටු නිකුත් කිරීම සහ සම්ප්‍රදායික දේශීය ධීවර යාත්‍රා යාන්ත්‍රිකරණය කිරීම වෙනුවෙන් ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 39 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 24 දක්වා අඩුවිය. මෙයින් රුපියල් දශ ලක්ෂ 10 ක් මිරිදිය ධීවර අංශය සඳහා යොදවන ලද අතර ඉතිරි ප්‍රමාණය මුහුදු ධීවර අංශය සඳහා යොදවන ලදී. වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ වාණිජ බැංකු දෙක වෙරළබඩ දිස්ත්‍රික්කයන්හි ධීවරයින් සඳහා වන ණය ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රමය යටතේ ධීවර යාත්‍රා, යන්ත්‍ර සහ ධීවර ආම්පන්න මිළදී ගැනීම සඳහා ණය සපයනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයේ. කෙසේ වුවද, පසුගිය කාලය තුළ ණය ආපසු ගෙවීම පැහැර හැරීමේ අනුපාතය ඉතා ඉහළ මට්ටමක වීම, ඉදිරි කාලය තුළ මෙම ක්‍රමය යටතේ ණය දීමේ අවදානම තවත් වැඩි කරවනු ඇත.

මුළු නිෂ්පාදන පිරිවැයෙහි ඉන්ධන වියදම් කොටසෙහි සාපේක්ෂ වැදගත්කම වැඩිවීම දිවයිනේ මුහුදු ධීවර අංශය මුහුණ දෙන තියුණු ප්‍රශ්ණයකි. එම නිසා ධීවර සංවර්ධන ප්‍රතිපත්තිය, බලශක්ති අඩුවෙන් වැයවන ක්‍රම කෙරෙහි යොමු කොට තිබේ. බලශක්ති පිරිමැසුම්දායක මිරිදිය ධීවර අංශයේ සංවර්ධනයට අමතරව යාන්ත්‍රික බෝට්ටු හඳුන්වා දීමෙන් පසුව වැදගත්කමින් අඩුවූ දැනට දිවයිනේ මුළු නිෂ්පාදනයෙන් සියයට 5 කට පමණක් දායක වන 'මාදැල්' මසුන් ඇල්ලීම පුනර්ජීවනය කිරීම සඳහා ද 1983 වර්ෂය තුළ පියවර කිහිපයක් ගනු ලැබිය. මින් එක් පියවරක් වූයේ මාදැල් ධීවරයින්ට ධීවර යාත්‍රා සහ ආම්පන්න, අළුත්වැඩියා කිරීම හා මිළ දී ගැනීමේදී දැරීමට සිදුවන මූලික වියදම් සඳහා රාජ්‍ය බැංකු මගින් ණය සැපයීමේ ක්‍රමයක් හඳුන්වා දීමයි.

වර්ෂය අවසානය වන විට 25,000 ක පමණ ඇස්තමේන්තු කළ සාමාජික සංඛ්‍යාවකින් යුත් ධීවර සමූපකාර 91 ක් විය. කෙසේ වුව ද, මෙයින් සමූපකාර විශාල ප්‍රමාණයක් ආයතනික වශයෙන් ශක්තිමත් තත්ත්වයක නොපැවති නිසා ඒවායේ ව්‍යුහය සහ ක්‍රියාකාරී ස්වභාවය රජයේ විමර්ශනයට ලක්වූ කරුණු විය.

1983 වර්ෂයේ කිරි නිෂ්පාදනය (මීකිරි ඇතුළුව) ලීටර් දශ ලක්ෂ 419 ක් ලෙස ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව ගණන් බලා ඇති අතර මෙය පූර්ව වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. විශේෂයෙන් පුන්නක්කු ඇතුළු ගව ආහාරවල මිළ ඉහළ යාම අහිතකර ලෙස බලපෑ නිෂ්පාදකයින්ට ප්‍රමාණවත් ලාභාන්තිකයක් ලබා දීම සඳහා ජාතික කිරි මණ්ඩලය 1983 මාර්තු මාසයේ දී කිරි සඳහා වන නිෂ්පාදක මිළ ගණන් සැළකිය යුතු ලෙස වැඩිකරන ලදී. එසේ වුවද, ජාතික කිරි මණ්ඩලය මගින් 1983 වර්ෂයේ එකතු කරන ලද කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්ෂ 53.9 දක්වා පසුගිය වසරට වඩා සියයට 2 කින් අඩු විය.

පශු සම්පත් සංවර්ධනය කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන් වර්ෂය තුළදී තවදුරටත් තීව්‍ර කරන ලදී. පවත්නා වැඩසටහන් නොකඩවා කරගෙන යාම සහ ඒවා (ප්‍රතිශක්තීකරණ වැඩ සටහන් සහ සතුන් ඇති කරන ගොවීන් සඳහා පශු වෛද්‍ය පහසුකම් සැපයීම වැනි) ව්‍යාප්ත කිරීමට අමතරව නව ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. වියළි කලාපීය දිස්ත්‍රික්ක හතරක පුරාණ ගම්වල සහ ජනපද ව්‍යාපාරවල කිරි පට්ටි පාලනය දියුණු කිරීම අරමුණු කරගත් ස්විට්සර්ලන්ත/ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය නොකඩවා කරගෙන යාම සඳහා 1983 වසර තුළ රුපියල් දශ ලක්ෂ 15 ක් ස්විට්සර්ලන්ත රජය මගින් සපයන ලදී. වර්ෂය ආරම්භයේදී බටහිර ජර්මන් රජයේ මූල්‍ය ආධාර ඇතිව එළු සම්පත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතට දිස්ත්‍රික්ක 9 ක් අඩංගු විය.[1] ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව තවත් මහා පරිමාණයේ ව්‍යාපෘතියක් 1983 ජුනි මාසයේ පටන් ගත් අතර මෙහි ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දශ ලක්ෂ 400 ක් විය. දිවයිනේ දිස්ත්‍රික්ක 10 ක්[2] ඇතුළත් වන මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ කිරි නිෂ්පාදිත, සත්ව බලය සහ ගව මස් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමයි. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි කිරීම පහසු කිරීම උදෙසා කිරි පට්ටි සංවර්ධන සමූපකාර සමිතිද පිහිටුවනු ඇත.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

1983 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 567 ක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර එය ඉකුත් වසරට වඩා සියයට 9 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණ.

සත්ව ආහාර නිෂ්පාදනය පිළිබඳ දත්තයන් ලබා ගත නොහැක. රාජ්‍ය අංශයේ ප්‍රධාන නිෂ්පාදිත ආයතන දෙකක් වන ලංකා තෙල් සහ මේද සංස්ථාව සහ සීමාසහිත රජයට පවරා ගත් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් සමාගමේ දත්තයන්ට අනුව එම ආයතනවල ගව ආහාර නිෂ්පාදනය 1982 මෙට්‍රික් ටොන් 12,597 සිට 1983 මෙට්‍රික් ටොන් 7,040 දක්වා සියයට 44 ක අඩුවීමක් වාර්තා කෙරිණ. මෙයට වෙනස්ව මෙම ආයතනවල කුකුල් කෑම නිෂ්පාදනය 1982 වර්ෂයේ මෙට්‍රික් ටොන් 52,100 සිට 1983 වර්ෂයේ මෙට්‍රික් ටොන් 61,140 දක්වා සියයට 17 ක වැඩිවීමක් වාර්තා කෙරිණ.

**ග්‍රාමීය ණය**

ආයතන කිහිපයක් විසින් විවිධ යෝජනා ක්‍රම යටතේ ග්‍රාමීය අංශයට ණය පහසුකම් සළසනු ලැබේ. ලංකා බැංකුව සහ මහජන බැංකුව මෙම අංශයට ණය සපයනු ලබන ප්‍රධාන ආයතන දෙක වේ. ලංකා බැංකුව සිය ග්‍රාමීය ණය වලින් වැඩි කොටසක් ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පිහිටි ස්වකීය උප කාර්යාල මගින් සපයනු ලබන අතර, මහජන බැංකුව දෙනු ලබන ග්‍රාමීය ණය වලින් සැළකිය යුතු කොටසක් සපයනු ලබන්නේ එය හා ඒකාබද්ධව පවතින සමූපකාර ග්‍රාමීය බැංකු මගිනි. හැටන් නැෂනල් බැංකුව ද ග්‍රාමීය අංශයට ණය පහසුකම් සපයනු ලබන නමුත්, එහි ක්‍රියාකාරිත්වය සමහර විශේෂ යෝජනා ක්‍රම කිහිපයකට සහ විශේෂ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමාවී ඇත. 1983 වර්ෂයේදී විදේශීය බැංකුවක් වන

1. මෙම දිස්ත්‍රික්ක නම් ගම්පහ, පුත්තලම, කුරුණෑගල, මන්නාරම, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, යාපනය, වව්නියාව සහ මඩකලපුව.
2. මාතර, ගාල්ල, කළුතර, කොළඹ, ගම්පහ, කෑගල්ල, පුත්තලම, කුරුණෑගල, මන්නාරම සහ යාපනය.

ඉන්දියානු විදේශ බැංකුවද සමහර නවාංගයන්ගෙන් යුතු ග්‍රාමීය ණය දීමේ වැඩ පිළිවෙලක් මාතර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලදී. ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින්ද ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශයක් වන අනුරාධපුරයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වුවද, මෙම වාර්තාවෙහි ප්‍රධාන වශයෙන්ම අඩංගු වන්නේ මහජන බැංකුව, ග්‍රාමීය බැංකු, ලංකා බැංකුව, ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පිහිටි එහි උප කාර්යාල සහ හැටන් නැෂනල් බැංකුව විසින් සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රම යටතේ දෙනු ලබන ණය පිළිබඳ විස්තර පමණි. මෙම ණය සඳහා නාමික පොළී අනුපාතිකයක් යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැළසීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී.

සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ඊට සහභාගිවන සියළුම බැංකු මගින් සපයන ලද මුළු ණය ප්‍රමාණය 1982 වගා වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 145.1 සිට 1983[1] වගා වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 168.1 දක්වා සියයට 16 කින් වැඩිවිය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ඒ ඒ බැංකු මගින් ඉකුත් වර්ෂයේ සපයන ලද ණය මුදල් ප්‍රමාණය හා සසඳා බලන කල සියයට 27 ක් වූ ඉහළම වැඩිවීම දක්නට ලැබුනේ ලංකා බැංකුව සම්බන්ධයෙන් වූ අතර, මහජන බැංකුව මගින් දෙන ලද ණය ප්‍රමාණය සියයට 22 කින් වැඩිවිය. හැටන් නැෂනල් බැංකුව විසින් දෙනු ලැබූ ණය ප්‍රමාණය සියයට 18 කින් අඩුවී ඇත. 1982 දී සපයන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 42 ක් ව තිබූ මහජන බැංකුවේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 44 ක් දක්වා (රුපියල් දශ ලක්ෂ 73.8) සුළු වශයෙන් වැඩිවිය. එමෙන්ම 1982 වගා වර්ෂයේදී සියයට 38 ක්ව තිබූ ලංකා බැංකුවේ සාපේක්ෂ කොටසද 1983 දී සියයට 42 දක්වා (රුපියල් දශ ලක්ෂ 70.2) සුළු වශයෙන් වැඩිවිය. හැටන් නැෂනල් බැංකුවේ සාපේක්ෂ කොටස සියයට 20 සිට සියයට 14 (රුපියල් දශ ලක්ෂ 24.3) දක්වා අඩුවී ඇත. පසුගිය වසරට වඩා සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 1982/83 මහ කන්නයේදී වී වගාව සඳහා දෙන ලද ණය වැඩිවීමය.

සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 1983 වගා වර්ෂයේදී වී වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය 1982 දී දක්නට ලැබුණු තත්ත්වය තවදුරටත් වර්ධනය වීමකි. ඉකුත් වසරේ දෙන ලද රුපියල් දශ ලක්ෂ 122.2 ට වඩා සියයට 20 කින් වැඩිවූ මෙම ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 146.0 ක් විය. පසුගිය වසරේ සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 84 ක් වූ වී වගාව සඳහා සපයන ලද ණය, 1983 දී සියයට 87 ක්ව ඇත.

මහජන බැංකුව විසින් වී වගාව සඳහා දෙන ලද ණය මුදල 1982 දී රුපියල් දශ ලක්ෂ 53.4 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 67.4 දක්වා සියයට 26 කින් වැඩි කර ඇත. ලංකා බැංකුව විසින් දෙන ලද ණය 1982 දී රුපියල් දශ ලක්ෂ 39.4 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 54.4 දක්වා සියයට 38 කින් වැඩිව ඇත. කෙසේ වුවද සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වී වගා ණය ප්‍රමාණයෙහි හැටන් නැෂනල් බැංකුව සතු කොටස 1982 දී රුපියල් දශ ලක්ෂ 29.4 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 24.3 දක්වා සියයට 17 කින් අඩුවී ඇත.

සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 1983 වගා වර්ෂය තුළදී වී වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 119.7 නැතහොත් එම ක්‍රමය යටතේ දුන් මුළු ප්‍රමාණයෙන් සියයට 90 ක් විය. මෙය ඉකුත් වසරේ මහ කන්නයේදී සපයන ලද ප්‍රමාණයට වඩා සියයට 19 ක වැඩිවීමකි. මහජන බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 50.6 ක් (මහ කන්නයේ මුළු වී වගා ණය මුදලින් සියයට 42 ක්) සපයනු ලැබූ අතර ලංකා බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 44.9 ක් (සියයට 38 ක්) සපයන ලදී. ඉතිරි රුපියල් දශ ලක්ෂ 24.3 සපයන ලද්දේ හැටන් නැෂනල් බැංකුව විසිනි. වී වගාව සඳහා නියඟය අහිතකර අයුරින් බලපෑවද ඉකුත් වසරේ

1. 1982 වගා වර්ෂයට 1981/82 මහ කන්නය සහ 1982 යල කන්නය අයත් වන අතර, 1983 වගා වර්ෂයට 1982/83 මහ කන්නය සහ 1983 යල කන්නය අයත් වේ.

### 1.18 සංඛ්‍යා සටහන

### සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද වගා ණය
### (1983 දෙසැම්බර් 31 වැනි දිනට තත්ත්වය)

(රු. දහස්)

| | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | මුළු ණය ප්‍රමාණය | | ස.ග්‍රා.ණ. ක්‍රමය යටතේ දුන් මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | මුළු ණය ප්‍රමාණය | වී | අතුරු ආහාර භෝග | |
| මහ 1981/82 .. | 47,048 | 5,776 | 52,824 | 32,488 | 8,250 | 40,738 | 20,840 | ... | 20,840 | 100,376 | 14,026 | 114,402 |
| යල, 1982 .. | 6,363 | 1,274 | 7,637 | 6,887 | 7,482 | 14,369 | 8,526 | 184 | 8,710 | 21,776 | 8,940 | 30,716 |
| වගා වර්ෂය, 1982 .. | 53,411 | 7,050 | 60,461 | 39,375 | 15,732 | 55,107 | 29,366 | 184 | 29,550 | 122,152 | 22,966 | 145,118 |
| මහ, 1982/83 .. | 50,601 | 3,761 | 54,362 | 44,850 | 9,648 | 54,498 | 24,252 | ... | 24,252 | 119,703 | 13,409 | 133,112 |
| යල, 1983 .. | 16,762 | 2,628 | 19,390 | 9,515 | 6,146 | 15,661 | — | — | — | 26,277 | 8,774 | 35,051 |
| වගා වර්ෂය, 1983* | 67,363 | 6,389 | 73,752 | 54,365 | 15,794 | 70,159 | 24,252 | ... | 24,252 | 145,980 | 22,183 | 168,163 |

* තාවකාලික දත්ත.

මූලයන්: මහජන බැංකුව;
ලංකා බැංකුව;
සීමාසහිත හැටන් නැෂනල් බැංකුව.

යල කන්නය හා සසඳා බලන කල 1983 යල කන්නයේදී වී වගාව සඳහා සපයන ලද මුළු ණය ප්‍රමාණය සියයට 21 කින් වැඩිව රුපියල් දශ ලක්ෂ 26.3 ක් විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ මෙම කන්නය තුළදී මහජන බැංකුව විසින් දෙන ලද ණය ප්‍රමාණය තුන් ගුණයකින් පමණ වැඩි වීමය.

වගා ණය ආපසු අය කර ගැනීම සම්බන්ධයෙන් 1983 ක්‍රියාකාරිත්වයෙහි දියුණුවක් දක්නට ලැබුණි. මහජන බැංකුව 1982/83 මහ කන්නයේ වී වගා ණය වලින් රුපියල් දශ ලක්ෂ 36.5 ක් නැතහොත් සියයට 72 ක් ආපසු අයකරගෙන තිබුණි. ඉකුත් වසර තුළදී 1981/82 මහ කන්නයේ වී වගා ණය වලින් ආපසු අයකර ගැනීමට හැකිවූ සියයට 42 ක අනුපාතය හා සසඳා බලන කල මෙය සැළකිය යුතු වැඩි දියුණුවීමකි. 1983 දෙසැම්බර් මස අග වනවිට 1982/83 මහ කන්නය සඳහා දෙන ලද වී වගා ණය වලින් රුපියල් දශ ලක්ෂ 29.9 ක් නැතහොත් සියයට 67 ක් ආපසු අය කර ගැනීමට ලංකා බැංකුව සමත් විය. මෙය පසුගිය වසරේ ආපසු අය කරගත් ප්‍රමාණයට සමානය. 1983 දෙසැම්බර් අවසානය වනවිට මහ කන්නය සඳහා දෙන ලද ණය වලින් සියයට 88 ක, වඩා ආපසු අය කරගැනීමේ සතුටුදායක අනුපාතයක් වාර්තා කිරීමට හැටන් නැෂනල් බැංකුව සමත් වුවද, සාපේක්ෂ වශයෙන් ගත් කල එමගින් දී ඇත්තේ අඩු ණය මුදලකි. කෙසේ වුව ද, ඉකුත් වර්ෂය තුළ 1981/82 මහ කන්නය සඳහා එම බැංකුව මගින් දෙන ලද ණය මුදලින් ආපසු අයකරගැනීමට හැකිවූ සියයට 71 හා සසඳා බලන කල 1983 වසර තුළදී ආපසු අය කරගත් අනුපාතිකය සැළකිය යුතු වැඩි දියුණුවීමක් වශයෙන් සැළකිය හැකිය.

අතුරු ආහාර භෝග වගාව සඳහා සපයන ලද ණය ප්‍රමාණය 1982 දී රුපියල් දශ ලක්ෂ 22.9 සිට 1983 දී රුපියල් දශ ලක්ෂ 22.2 දක්වා සියයට 3 කින් පහත වැටී ඇත. එම මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 15.8 ක් නැතහොත් සියයට 72 ක්ම සපයන ලද්දේ ලංකා බැංකුව විසිනි. පසුගිය වසරේ මේ සඳහා ලංකා බැංකුව විසින් සපයන ලද්දේ මුළු ණය මුදලින් සියයට 69 ක් පමණි.

සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ අතුරු ආහාර භෝග වගාව සඳහා සපයනු ලබන ණයවල සඳහන් කළ යුතු ලක්ෂණයක් නම්, එබඳු ණය වලින් වැඩි කොටසක් අර්තාපල්, ළූණු සහ මිරිස් වගාවට පමණක් සීමාවීම වන අතර, අනෙකුත් අතුරු ආහාර භෝගවලින් වැඩි කොටසක් ඇත්ත වශයෙන්ම මෙම ආයතනික ණය රටාවෙන් පරිබාහිරව පැවතීමයි. මෙම භෝග සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුම, වගාවන් වැඩි දියුණු කිරීමට ඇති හැකියාව සහ වගා රටාව විවිධාංගීකරණය කිරීමට ඇති අවශ්‍යතාව යන කරුණු අනුව සළකා බලන කල මෙම යෝජනා ක්‍රමය යටතේ අතුරු ආහාර භෝග වගාව සඳහා සපයනු ලබන ණය ප්‍රමාණය පුළුල් කිරීම හදිසි අවශ්‍යතාවක්ව පවතී.

1977 ජනවාරි පළමු වැනිද සිට 1981 ජුනි 30 වැනි දින දක්වා සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද පැහැර හැරි ණය නැවත උප ලේඛනගත කිරීමේ යෝජනා ක්‍රමය ලංකා බැංකුව විසින් වර්ෂය තුළදී දිගටම ක්‍රියාත්මක කරන ලදී. නැවත උප ලේඛනගත කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 1984 ජුනි මස 30 වැනි දින දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද මෙම යෝජනා ක්‍රමයේ ප්‍රගතිය බෙහෙවින් අසාර්ථකව පවතින අතර, එහි ප්‍රති-ඵලයක් වශයෙන් සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙනු ලබන ණය සඳහා තවමත් ගොවීන්ගෙන් වැඩි කොටසක් සුදුසුකම් නොලබති.

වර්ෂය තුළදී ග්‍රාමීය ණය හා සම්බන්ධ ප්‍රධාන ආයතන නියෝජනය කෙරෙන සාමාජිකයින්-ගෙන් සමන්විත ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් ග්‍රාමීය ණය හා සම්බන්ධ යෝජනා කිහිපයක් සළකා බලන ලදී. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම සහ රබර් හා උක්-වගාකරුවනට ආධාර දීම සඳහා ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීම යන යෝජනා මෙයට

ඇතුළත් විය. රාජ්‍ය අංශයේ බැංකු වලට ග්‍රාමීය ණය කටයුතු වලින් සාධාරණ ලාභ මට්ටමක් ලබා ගැනීම සඳහා උපකාරී විය හැකි ක්‍රම පිළිබඳව ද ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් සලකා බලන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම සඳහා නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ කටයුතු වර්ෂයේ අග භාගය තුළදී කරගෙන යන ලදී.

මෙම වාර්ෂික වාර්තාවේ වෙනත් ස්ථානයක සවිස්තරව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ශාඛාවන් විසින් ග්‍රාමීය ප්‍රදේශවල ස්වයං රැකියා වර්ධනය කිරීම සහ ග්‍රාමීය ආර්ථිකයේ වර්ධනය සහ සංවර්ධනය සහතික කිරීමේ අරමුණින් ඒවායේ විශේෂ ග්‍රාමීය ණය සැපයීමේ වැඩපිළිවෙල වඩා පුළුල් පරිමාණයෙන් නොකඩවා කරගෙන යනු ලැබීය.

## කර්මාන්ත[1]

වර්තන වටිනාකම් අනුව, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 10 ක් ලෙස වාර්තා වී ඇත. මූර්ත වටිනාකම් අනුව කාර්මික නිමැවුම සියයට 2 කින් වර්ධනය වූ බවට ඇස්තමේන්තු කර තිබේ. 1983 වර්ෂය තුළදී කාර්මික නිෂ්පාදන අනුපාතයේ වේගයෙහි අඩුවීමක් තිබූ බව සඳහන් කළ යුතු වේ. පසුගිය අවුරුදුවලදී වර්ධනයේ වේගය අඩු වුවද මෙම අංශය අපනයනාභිමුඛ සංවර්ධන උපාය මාර්ගයේ ක්‍රියාශීලි කොටසක් ඉටු කළේය. ඉදිරි වර්ෂවල දිවයිනේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය පිළිබඳව සැලකිය යුතු බලපෑමක් සහතික කෙරෙන ආයෝජකයන් ඇදගැනීමේ කර්තව්‍යය, මෙම අංශය මගින් විවිධ දිරිගැන්වීම් යටතේ නොකඩවා කරගෙන යනු ලබයි. අපනයන ඉපැයුම්වලට මෙම අංශයේ ඇති දායකත්වය 1978 සියයට 14 සිට 1983 දී සියයට 35 දක්වා වැඩිවිය. මෙමගින් ආර්ථිකයේ ව්‍යුහාත්මක ස්වරූපයේ වෙනසක් හැඟවෙයි. කෙසේ වුවද, මෙම කරුණ තේරුම්ගත යුත්තේ දේශීය එකතුකළ අගයේ වටිනාකම සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමක පවතින ඇඟලුම් සහ ඛනිජ තෙල් නිෂ්පාදිතවල ඇති වූ කාර්මික අපනයන වර්ධනය සඳහා ඉඩහැරීමෙන් අනතුරුවයි.

1983 වර්ෂයේ වර්ධන වේගයේ මෙම අඩුවීමට රාජ්‍ය අංශයේ සංස්ථාවල නිමැවුමේ අඩුවීම විශාල ලෙස බලපාන ලදී. දළ වටිනාකම් අනුව, කාර්මික නිෂ්පාදිතයෙහි ඉහළ බරතැබීමකට හිමිකම් කියන ඛනිජ තෙල් පිරිපහදුව 1983 වර්ෂයේ මුලදී සති අටක කාලයක් තුළ වසා තැබීම එහි නිමැවුම සියයට 21 කින් පහත වැටීමට හේතු විය. රාජ්‍ය අංශයේ කර්මාන්තවල මුල් බැසගත් ඌණ උපයෝගීකරණ ප්‍රශ්නය, 1983 වර්ෂයේදී වඩාත් නරක අතට හැරුනේ කාර්මික නිෂ්පාදිතය මත බරපතල බලපෑම් ඇති කරමිනි. එම සංස්ථාවල පාලනයෙන් පරිබාහිර හේතූන් වූ විදුලිබලය කපාහැරීම් සහ ජූලි කලබල සමයේදී වැඩ කරන පැය ගණන අඩු කිරීම මීට අර්ධ වශයෙන් බලපෑවේය. කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ වර්ධනය ප්‍රසංශනීය එකක් විය. එමගින් රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනයේ අඩුවීම සමනය වීමටද බලපෑමක් ඇතිවිය.

---

1. පසුගිය වර්ෂවලදී මෙන්ම 1983 වර්ෂයේදීද කර්මාන්ත අංශයේ ප්‍රගතිය පිළිබඳ දත්තයන් පදනම් කොටගත්තේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ලොකු, මධ්‍යම සහ කුඩා සියළුම වාර්තාගත සහ ප්‍රසිද්ධ නිමැවුම් කර්මාන්තයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යවන ලද ප්‍රශ්නාවලියකට ලැබුණු පිළිතුරුයි. (කෙසේ වුවද, ජාතික ආදයම ගණනය කිරීමේදී, කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස වර්ග කරනු ලබන වැවිලි කර්මාන්තයට සම්බන්ධ අපනයන සැකසුම් කටයුතු මීට ඇතුළත් කර නැත). පොදුවේ ගත් කල ආමන්ත්‍රිත ආයතනයන්ගෙන් තුනෙන් පංගුවකින් පමණ පිළිතුරු ලැබුණ අතර ඒවායින් ප්‍රධාන කර්මාන්ත සියල්ලම පාහේ නියෝජනය විය. දත්තයන් ලබාගත නොහැකි වූ අංශයන් පිළිබඳව විවිධ රාජ්‍ය ආයතනයන් හා සංවිධානයන්ගෙන් ලබාගත හැකිවූ තොරතුරු පදනම්කොට කැරුනු ඇස්තමේන්තු ප්‍රයෝජනයට ගනු ලැබිණ.